රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சு
Ministry of State Resources and Enterprise Development

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
பரந்தன் கெமிக்கல்ஸ் கம்பனி லிமிடெட்
Paranthan Chemicals Company Limited

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report 2013

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය
සංවර්ධන අමාත්‍යාංශය

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2013

පටුන

සමාගමේ පසුබිම ____ 01

දේශීය රසායනික වෙළඳපොල සහ එහි අභියෝගයන් ____ 03

සංස්ථාපිත තොරතුරු ____ 04

සමාගමේ දැක්ම - මෙහෙවර - ඉලක්ක සහ අරමුණු ____ 06

සභාපතිතුමාගේ සමාලෝචනය ____ 08

සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය ____ 12

2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව ____ 15

2015 වර්ෂය තුල දී ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග ____ 21

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය ____ 22

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් කොටස් හිමියන් වෙත ඉදිරිපත් කෙරුණු විගණක වාර්තාව ____ 23

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය ____ 24

2013 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය ____ 25

2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ මූලධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ____ 26

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ____ 27

2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ගිණුම් සඳහා සටහන් - සංසන්දනාත්මක අනුපාතිකයන් ____ 29

2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ____ 30

2013 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් සඳහා සටහන් ____ 39

ආයතනික සැලැස්ම උපායමාර්ගික ව්‍යාපාරික ඒකකය ____ 47

වර්තමාන සංවිධාන සැලැස්ම ____ 48

2013 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2014 වසර සඳහා අයවැයගත සංඛ්‍යා ____ 49

සමාගමේ කාර්යය සාධනය ඇගයීම ____ 50

ආයතනික යහපාලනය ____ 51

විගණන කමිටු වාර්තාව ____ 55

ප්‍රධාන මූල්‍යමය අවස්ථා ඇතුලත් පස් අවුරුදු සාරාංශය ____ 57

රැස්වීම පිළිබඳ දැන්වීම ____ 58

සමාගමේ පසුබිම

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය - 2013
පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

වමේ සිට දකුණට
බී . පී.ගුණවර්ධන මයා (අධ්‍යක්ෂ),මායලඝු ශෂිකරන් මයා (අධ්‍යක්‍ෂ), එච්. එම්. ආර්. කිරිඇල්ල මයා එච්. ඒ. එන්. එස්. කුමාර මයා (අධ්‍යක්‍ෂ), ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා (සභාපති) ආනන්ද ජයසිරි ගමගේ මයා (විධායක අධ්‍යක්‍ෂ) ඩී.ස්වර්ණපාල මයා (අමාත්‍යංශ නිරීක්‍ෂක) අභිජිත් විශ්වමිත්‍ර මයා, එච්. එල්. විපුල සිල්වා (අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්)

පරන්තන් කෙමිකල්ස් රසායන සමාගම රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක් වන අතර දේශිය කර්මාන්තවලට අවශ්‍ය ප්‍රධාන රසායනික ද්‍රව්‍යයන් වන දියර ක්ලෝරීන් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ආනයනය කර වෙළඳපොලට සැපයීම සිදු කරනු ලබයි. දියර ක්ලෝරීන් වෙළඳපොලේ ප්‍රධාන සැපයුම්කරුවා වන පරන්තන් කෙමිකල්ස් සමාගම අනෙකුත් රසායනික ද්‍රව්‍ය සඳහා ද වෙළඳපොලෙන් සැලකිය යුතු කොටසකට හිමිකම් කියනු ලබයි.

1950 දශකයේ උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි රජයේ කර්මාන්තශාලාවක් වශයෙන් ආරම්භ කරන ලද පරන්තන් රසායනික කර්මාන්තශාලාව 1957 වර්ෂයේ දී පරන්තන් කෙමිකල්ස් සංස්ථාව වශයෙන් ස්ථාපනය කරන ලදී. 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ ආරම්භයේ දී මෙම කර්මාන්තශාලාව මගින් දේශිය ලුණු අමුද්‍රව්‍යක් වශයෙන් භාවිතා කරමින් කෝස්ටික් සෝඩා, දියර ක්ලෝරීන්, හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ප්‍රධාන නිෂ්පාදන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ්, ෆෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු අතුරු නිෂ්පාදන වශයෙන් ද වෙළඳපොලට ඉදිරිපත් කරන ලදි. 1985 දී ත්‍රස්තවාදී කලබල හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලාවේ වැඩකටයුතු නවතා දමන ලද අතර දේශීය කර්මාන්තවලට එනම් ජල පිරිපහදුවට සබන් නිෂ්පාදනයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ආනයනය කර සැපයීමට සිදු විය. කර්මාන්තශාලාව වසා දැමීම සිදු වීම මගින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් රටින් පිටතට ඇදී ගිය අතර රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ද දේශයට අහිමි විය.

දැනට ක්‍රියාත්මක වන පරන්තන් කෙමිකල්ස් සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පොදු සමාගම් පනත යටතේ 1991 ජනවාරි 17 වන දින සංස්ථාපනය කරන ලදි. රජයට අයත් සමාගමක් වන පරන්තන් කෙමිකල්ස් සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කල අතර සමාගම් පනතින් නියම කරන ලද යහපාලන ප්‍රතිපත්ති හා රජය විසින් පනවා ඇති ප්‍රතිපත්තීන්වලට අනුකූලව කටයුතු සිදු කරනු ලබයි.

සමාගම විසින් දේශිය වෙළඳපොලට අවශ්‍ය දියර ක්ලෝරීන් කිලෝග්රෑම් 900 සිලින්ඩරවලින් ආනයනය කරනු ලබන අතර ඉන් කොටසක් කිලෝග්රෑම් 68 සිලින්ඩරවලට නැවත පිරවීම ආයතනයේ නැවත පිරවුම් ඒකකය මගින් සිදු කරනු ලබයි. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමහරක් මධ්‍යස්ථානවලට හා සමහරක් සුලු පරිමාණයේ ගැනුම්කරුවන්ටද කුඩා සිලින්ඩර් සපයනු ලබන අතර එමගින් සුලු පරිමාණයේ කර්මාන්තකරුවන්ට විශාල සේවයක් ඉටු කිරීමට සමාගමට හැකි වී ඇත.

ආනයනය කරනු ලබන සියලුම සිලින්ඩර් අන්තර් ජාතික තත්ත්ව පරික්ෂණවලට යටත්ව භාවිතා කරනු ලබන අතර දේශිය නැවත පිරවුම් කටයුතු අන්තර්ජාතික තත්වයන්ට අනුකූලව සිදු කරනු ලබයි. දිවයිනේ ක්ලෝරීන් ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති කාර්ය මණ්ඩලයක් සමාගම සතු වන අතර මේ වන විට ජලාපවහන මණ්ඩලයේ ක්ලෝරීන් භාවිතය සම්බන්ධ නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු ද ආයතනය විසින් සිදු කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ගබඩාව අංක 100/25 ශ්‍රී රාමනාදන් මාවතේ පවත්වා ගෙන යනු ලබන අතර පරන්තන්හි පිහිටි අක්කර 227 භූමිය නව කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා වෙන් කර ඇත. කළුතර නාගොඩ

කර්මාන්ත පුරයේ පිහිටි අක්කර 2 1/2 ක භූමිය ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු පරිපාලනය කිරීම සඳහා යොදා ගෙන ඇත. 2013 වසරේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ සමස්ත සේවක සංඛ්‍යාව 67 ක් විය. සමාගම විසින් පසුගිය වසර කිහිපය තුළම රජයට ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු ලාභයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කර ඇත.



පරන්තන් පැරණි කර්මාන්තශාලාව

දේශිය රසායනික වෙළඳපොල සහ එහි අභියෝගයන්

ශ්‍රී ලංකාවේ රසායනික වෙළඳපොල ප්‍රධාන අංශ කිහිපයකින් සමන් විත වේ.

- කෘෂි රසායන
- කර්මාන්තවලට අවශ්‍ය රසායන
- රබර් කර්මාන්තයට අවශ්‍ය රසායන
- තීන්ත නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්තයන්ට අවශ්‍ය රසායන
- ආහාර සහ බීජ නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- පුද්ගල පරිහරණයට අවශ්‍ය රසායන

රටක් වශයෙන් ශ්‍රී ලංකාව විශාල රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් පරිහරණයට ගන්නා අතර එම මුළු ප්‍රමාණයම වාගේ වාර්ෂිකව ආනයනය කරනු ලබයි.

පරන්තන් කෙමිකල්ස් සමාගම ප්‍රධාන වශයෙන් ජල පිරිපහදු, රසායනික සහ රබර් සහ ශීතාගාර වැනි විවිධ කර්මාන්තයන්ට අවශ්‍ය රසායනික වෙළඳපොල කටයුතු කරමින් සිටියි.

පරන්තන් කෙමිකල්ස් සමාගමේ විකුණුම් වලට අදාළ ශ්‍රී ලංකාවේ සමස්ත වෙළෙඳපොල වටිනාකම වසරකට ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.60 පමණ වන බව ගනන් බලා ඇත. මුළු වෙළඳපොලෙහි පරන්තන් කෙමිකල්ස් සමාගම දරණ දායකත්වය ඉහළ නැංවීමට වර්තමානයේ කටයුතු කරමින් සිටින අතර ඉදිරි වසර 5 තුළ වෙළඳපොල ප්‍රමුඛයා වීමට අපේක්ෂා කෙරේ.

පරන්තන් කෙමිකල්ස් සමාගම 100% ක් රජය සතු ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර ආයතනයේ ඉදිරි අරමුණ සමාගමේ සංයුක්ත සැලැස්මේ සඳහන් කර ඇති ආකාරයට ලගා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

සංස්ථාපිත තොරතුරු

නීතිමය ස්වභාවය	:	1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත වගකීමකින් යුතු පොදු සමාගමක් වශයෙන් ලියාපදිංචි කර 1991 දී සංස්ථාපනය කරන ලදුව පසුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචිය සිදු කර ඇත. පොදු සමාගමක් බවට පත් කිරීම පොදු ව්‍යාපාර හෝ රජයට අයිති ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 පනත් අංක 23 ට අනුකූලව සිදු කර ඇත. පරන්තන් රසායන සමාගමට හිමිව තිබූ අධිකාරී බලය සහ ක්‍රියාකාරකම් සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් නැවතත් පරන්තන් කෙමිකල්ස් සමාගමට පවරන ලදී.
සංස්ථාපිත දිනය	:	1957 දී ස්ථාපිත කරන ලද අතර 1991 ජනවාරි 17 වෙනි දින නැවත සංස්ථාපනය කරන ලදී.
ප්‍රධාන කාර්යාලයේ ලිපිනය	:	100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13, ශ්‍රී ලංකාව.
කර්මාන්ත ඒකකය	:	පුලර්ටන් වත්ත, කළුතර.
දු.අංක/ප්‍රධාන කාර්යාලය	:	+94 11 2437555-6-7; +94 11 2437831; +94 11 2387109; +94 11 2437829
දු. අංක - කර්මාන්ත ඒකකය	:	+94 34 2289976
ෆැක්ස්	:	+94 11 2437555
විද්‍යුත් තැපෑල	:	pccltd@sltnet.lk
වෙබ් අඩවිය	:	www.paranthanchemicals.gov.lk
ප්‍රධාන බැංකුකරුවෝ	:	මහජන බැංකුව - ලංකා බැංකුව -හැටන් නැෂනල් බැංකුව- සම්පත් බැංකුව
ව්‍යවස්ථාපිත විගණකවරු	:	හේමචන්ද්‍ර සහ සමාගම - වරලත් ගණකාධිකාරිවරු
සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	:	ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා
විධායක අධ්‍යක්ෂ	:	ආනන්ද ජයසිරි ගමගේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩලය	:	• ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා • ආනන්ද ජයසිරි ගමගේ මහතා • එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා • මායලසු ශෂිකරන් මහතා • එච්. ඒ. එන්. එස්. කුමාර මහතා • බී . පී.ගුණවර්ධන මහතා • ජේ .ඩී. ඒ. විශ්වමිත්‍ර මහතා • ඩී. එම්. පී. ඒ . දසනායක මහතා - (විශ්‍රාම ලැබූ දිනය : 2013 ජුනි 24) • ජී. සරත් කුමාර මහතා - (විශ්‍රාම ලැබූ දිනය : 2013 සැප්තැම්බර් 17)
අධ්‍යකෂ මණ්ඩල ලේකම්	:	එච්. එල්. විපුල සිල්වා මහතා
ප්‍රධාන නිලධාරීන්	:	• එස්. අනුර සිරිවර්ධන මහතා - සාමාන්‍යාධිකාරි • ඩබ්ලිව්. ඩී. කීර්තිලතා මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි • ඩී. එම්. ටී. එස් . දිසානායක මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) • තිස්ස ලියනගේ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු) • ඩබ්ලිව්. එස්. කේ. වෛද්‍යසේකර මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරි (සැපයුම්) • කේ. ආර්. කේ. ජයවීර මහතා - සහකාර සාමාන්‍යාධිකාරි (මුල්‍ය)
අභ්‍යන්තර විගණක	:	ලියනගේ සහ සමාගම - වරලත් ගණකාධිකාරිවරු (පත්වීම් දිනය : 2012 අප්‍රේල්)

සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය - 2013

සභාපතිතුමා - අධ්‍යක්ෂවරු - ජ්‍යෙෂ්ඨ කළමනාකරණය - 2013
පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

ඉදිරි පෙළ

බී . ජී. ගුණවර්ධන මයා (අධ්‍යක්ෂ), මායලඝු ශෂිකරන් මයා (අධ්‍යක්‍ෂ), එච්. එම්. ආර්. කිරිඇල්ල මයා (අධ්‍යක්‍ෂ), එච්. ඒ. එන්. එස්. කුමාර මයා (අධ්‍යක්‍ෂ), ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ (සභාපති), ආනන්ද ජයසිරි ගමගේ මයා (විධායක අධ්‍යක්‍ෂ) ඩී. ස්වර්ණපාල මයා (අමාත්‍යංශ නිරික්ෂක), ජේ. ඩී. අභිජිත් විශ්වමිත්‍ර මයා (අධ්‍යක්‍ෂ), එච්. එල්. විපුල සිල්වා මයා (අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්)

පසු පෙළ

ඩී. එම්. ටී. එස්. දිසානායක මයා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි), තිස්ස ලියනගේ මයා, (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු), ඩබ් ලිව්. ඩී. කීර්තිලතා මිය (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී), අනුර සිරිවර්ධන මයා (සාමාන්‍යාධිකාරී), ඩබ්ලිව්. එස්. වෛද්‍යසේකර මිය (සහකාර සාමාන්‍යාධිකාරී - සැපයුම්), කේ. ආර්. කේ. ජයවීර මයා (සහකාර සාමාන්‍යාධිකාරී - මුල්‍ය)

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය 2013

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
සභාපති සහ ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය - 2013
රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

වමේ සිට දකුණට
පළමු වන පේළිය
ටී.ලියනගේ මයා, ඩබ්ලිව්. එස්. වෛද්‍යසේකර මිය, ඩී. එම්. ටී. එස්. දිසානායක මයා, ඒ. ජේ. ගමගේ මයා, ඩී. ජේ. යු. පුරසිංහ මයා, එස්. අනුර සිරිවර්ධන මයා, ඩබ්. ඩී. කීර්තිලතා මිය, කේ. ආර්. කේ. ජයවීර මයා,

දෙවන පේළිය
පී. ඩී. නුවන් මයා, කේ. පී. ඩී. පෙරේරා මිය, ඩල්සි ලොකුවිතාන මිය, කේ. එස්. සමරසිංහ මිය, එච්. ඩී. ආර්. වයි. හේවාදේව මිය, එස්. එන්. කේ. ගුණසේකර මයා, ඩබ්. නිහාල් මයා, එල්. ඩී. ආර්. ඩී. ගෝකුල මයා, ඒ. ඩී. ජේ. කද්රාමර මයා, එම්. ඩී. පී. කරුණානායක මිය, බී. තවරාජා මෙනෙවිය, පී. අයි. ගුණරත්න මිය.

තුන් වන පේළිය
කේ. එල්. ඩී. එස්. සුබෝධිනි මිය, එන්. යුරේෂා දිල්හානි මෙනවිය, කේ. කේ. රුවන් දිකා මෙනෙවිය, කේ. රවිකාන්ත මයා, ටී. එස්. නලින්ද ද සිල්වා මාය, ඒ. එස්. නිරෝෂන මයා, එස්. ඩී. පතිනායක මයා, ටී. එස්. වී. නිලන්ප්‍රියා මයා, කේ. එන්. සංජීව මයා, එල්. ඩී. ජී. පී. සම්පත් මයා. ඩී. වී. එම්. එස්. සමරසිංහ මෙනෙවිය, එන්. එම්. ප්‍රනාන්දු මෙනෙවිය සී. කේ. ඕ. විදුෂිකා මෙනෙවියා.

සිව් වන පේළිය
ආර්. එම්. සිරිපාල මයා, සී. මනෝහරම්මාල් මිය, කේ. කේ. සුනිල් මයා, එම්. එස්. එන්. කුමාර සිල්වා මයා, එච්. ඩී. ඒකනායක මයා, පී. ඩී. ඒ. ප්‍රියශාන්ත මයා, ඇන්තනි ප්‍රනාන්දු මයා, ආර්. පී. ඩී. පුෂ්පකුමාර මයා, සී. වීරසේකර මයා, එච්. ඩී. එන්. එච්. සිරිවර්ධන මයා, එච. ඒ. එන්. ඩී. වීරසේකර මයා, ජේ. ඒ. ජේ. පෙරේරා මයා, පී. ඩී. ප්‍රදීප් මයා, එස්. ආර්. ඒ. කේ. සුගත් මයා.

සමාගමේ දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ රසායනික නිෂ්පාදන හා වෙළඳපොල පෙර ගමන්කරු ලෙසත් රාජ්‍ය අනුග්‍රහය සහිත වෙළඳපොල නියාමක ලෙසක් අනාගතයේ දී වෙළඳපොල තුල ස්ථාපිත වීම.

මෙහෙවර

කර්මාන්තවලට අවශ්‍ය තත්ත්වයෙන් උසස් රසායන යෙදවුම් රට තුල නිෂ්පාදනය කර හෝ ආනයනය කර සැපයීම මගින් දේශීය රසායන කර්මාන්තවල ගුණාත්මක භාවය වැඩි කිරීමට දායකවීම.

ඉලක්ක

- ශ්‍රී ලංකවේ රසායන වෙළඳපොල තුල නියමුවා බවට පත්වීම.
- පරන්තන් හි කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් කර්මාන්ත ශාලාව නැවත ක්‍රියාත්මක කරවීම.
- බ්ලීචිං පවුඩර් හා සල්පියුරික් අම්ල ආදිය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ඒකක ස්ථාපිත කිරීම.
- සේවක තෘප්තිමත් භාවය වර්ධනය කිරීම සහතික කිරීම සහ ඔවුන්ගේ කැපවීම හා උපරිම සේවාව සමාගමට ලබා ගැනීම.
- ආයතනය තුළ දැනට පවතින භෞතික සම්පත් හිගතාවය මගහැරීම

ආයතනයේ අරමුණු

සමාගමේ ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ ප්‍රධාන අරමුණු පහත දැක් වේ.

මූලික අරමුණු

"1955 අංක 19 දරණ පනතේ රාජ්‍ය සංස්ථා සඳහා වන වගන්තිය සහ 1956 මාර්තු 01 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 10898 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ පසුව සංශෝධනය කරමින් ඉදිරිපත් වූ 1957 අංක 49 දරණ රජයේ කර්මාන්ත සංස්ථා පනතේ 2 වැනි වගන්තියට අනුව සහ 1959 ජනවාරි 01 වන දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් අංක 11, 632 ට අනුව, සංස්ථාපනය කරන ලද පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ කටයුතු කර ගැනීම හා පවත්වාගෙන යාම සඳහා,

අ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම නිශ්චල හා චංචල දේපලවල හිමිකාරිත්වය දැරීම.

ආ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ හිමිකාරිත්වය පැවති සියලුම වත්කම් පුරස්කාර අයිතිය, අධිකාරීමය බලය, වරප්‍රසාද හා වත්කමෙන් පැන නගින අයිතීන් සඳහා හිමිකාරිත්වය දැරීම.

ඇ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම වගකීම් දැරීම

ඈ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ ගිණුම් භාර ගැනීම, පවත්වාගෙන යාම හා ව්‍යාපාරයට අදාළ ලියකියවිලි හැසිරවීම.

ඉ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම කොන්ත්‍රාත් සහ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම.

ඊ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාව විසින් පවත්වා ගෙන පැමිණි නීතිමය කටයුතු පවත්වා ගෙන යාම.

එ. ශ්‍රී ලංකාවේ පවත්නා නීති රීතිවලට අනුව සේවකයන් හට සමාගමේ කොටස් මිලදී ගැනීම සඳහා කොටස් භාරයක් ස්ථාපිත කිරීම.

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම

i. ඩී.ඩී.ටී. මදුරු නාශක දියර, කෝස්ටික් සෝඩා, ක්ලෝරීන්, සල්ෆියුරික් අම්ලය, පොහොර, දිලීර නාශක, කෘමිනාශක ද්‍රව්‍ය වැනි ඉහත දක්වා ඇති කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය, සේදුම්කාරක සහ වෙනත් රසායනික ද්‍රව්‍යයන් නිෂ්පාදනය හා විකිණීම.

ii. ඉහත දක්වා ඇති නිෂ්පාදන ක්‍රියාවලීන්හි දී නිපදවන හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය, සින්ක් ක්ලොරයිඩ්, පෙරික් ක්ලෝරයිඩ් සහ මේස ලුණු වැනි ඕනෑම අතුරු නිෂ්පාදනයක් සංවර්ධනය කිරීම, නිපදවීම හා අලෙවි කිරීම.

iii. ඉහත දක්වා ඇති ඕනෑම නිෂ්පාදනයක් ආනයනය කිරීම හා විකිණීම.

iv. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම, තොග පවත්වා ගෙන යාම, විශ්ලේෂණ රසායනය, වියළි ලුණු නිෂ්පාදනය, තෙල් සහ වර්ණක, ආනයනය සහ අපනයනය, ප්ලාස්ටික් නිෂ්පාදනය සහ වෙළඳාම, සින්තටික් හා ෆයිබර් විශාල සහ කුඩා රසායනයන්, ඖෂධ සාරය, පලතුරු බීම, අම්ල, රසායනික ද්‍රව්‍යයන්, කර්මාන්ත හා වෙනත් සැකසීම්, ඛනිජ සහ ජලය, පුපුරණ ද්‍රව්‍ය, වෙඩි බෙහෙත්, නිෂ්පාදන සහ සියලුම ආකාරයේ උපාංග, පණුබෙහෙත්, දිලීර නාශක, සිමෙන්ති, තීන්ත, වාර්නිෂ්, ඖෂධ, සියලුම ආකාරයේ විදුලි, රසායනික, ඡායාරූපකරණය, ශල්‍ය හා විද්‍යාත්මක උපකරණ සහ සමාන ද්‍රව්‍ය හෝ සම්බන්ධිත ව්‍යාපාර වැනි, ඉහත ව්‍යාපාරවලට යොමු වීම.

වර්තමානයේ සමාගමේ කාර්යභාරය

දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා පතුරු හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආදිය ආනයනය කිරීමත් විකිණීමත් පරන්තන් කෙමිකල්ස් සමාගමේ වර්තමාන ප්‍රධාන ක්‍රියාවලියයි.

සභාපතිතුමාගේ සමාලෝචනය

පිළිගැනීම

පරන්තන් කෙමිකල්ස් සමාගමේ 23 වැනි මහා සභා රැස්වීම සඳහා සහභාගි වූ එකම කොටස්කරු වන මහා භාණ්ඩාගාරයේ ලේකම් නියෝජනය කරමින් ඔහුගේ පෙරකලාසිකරු වශයෙන් ඔබතුමිය සහ අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශවකරුවන් පිළිගැනීම මාගේ සතුටට හේතු වන අතර එය මාගේ වරප්‍රසාදයක් ද වේ. මෙදින 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය වාර්තාව මම සතුටින් ඉදිරිපත් කරමි.

ආර්ථික සමාලෝචනය

2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව මගින් සමාගම මහත් වෙහෙසක් දරා ඉටු කළ ක්‍රියාකාරකම් පිළිබඳ වැදගත් තොරතුරු, සමාගමේ නිෂ්පාදන, අලෙවිය හා සිදු වූ සංවර්ධන කටයුතු ආදිය කෙටියෙන් ඉදිරිපත් කරයි.

සමාලෝචිත වර්ෂය, ලංකාව අවුරුදු 30 ක කාලයක් පැවැති ත්‍රස්තවාදී ගැටුම්වලට මුණ දී ඉන් පසු උදා වූ සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳින 4 වන වර්ෂය ලෙස හැඳින්විය හැක. ලැබූ සාමයත්, සමාගමේ ප්‍රගතියත් දේශයේ නවක බලාපොරොත්තු ළඟාකර ගැනීමට පිටිවහලක් වනු ඇත.

උදා වූ සාමයෙන් පසු 2013 වර්ෂයේ දී රටේ ආර්ථිකයේ 7.30% වර්ධනයක් ඇති කර ගැනීමට සමත් වුණු අතර දේශීය ඉල්ලුමෙහි වර්ධනයක් ඇතිවීම, අපනයන සහ සංචාරක අංශය දියුණු වීම, තොග සහ සිල්ලර වෙළඳාම, හෝටල් අංශය, භෝජන ශාලා, ප්‍රවාහන සේවා , බැංකු සේවා, රක්ෂණ අංශය, ඉඩම් හා නිවාස විකිණීම ආදී අංශවල සීඝ්‍ර වර්ධනයක් ඇති විය. සේවා අංශයේ වර්ධනය 4.6% සිට 6.4% දක්වා ඉහළ නැඟිණි. කර්මාන්ත අංශ 9.9% තෙක් වර්ධනය වුණු අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව මඳක් අඩුය. පතල් කර්මාන්තය, ඛනිජ ද්‍රව්‍ය කර්මාන්තය හා ඉදිකිරීම් කර්මාන්තයෙහි දක්නට ලැබුණු අඩු වර්ධනය කර්මාන්ත අංශයේ ලැබූ වර්ධනය හේතුවෙන් සමනය කරගැනිමට හැකි විය. යහපත් දේශගුණයක් පැවති හෙයින් කෘෂි කාර්මික අංශයෙහි 4.7% ක වර්ධනයක් පවත්වා ගැනීමට හැකි වී ඇත.

කොළඹ වරාය පුළුල් කිරීම, හම්බන්තොට වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය, මහා මාර්ග, දුම්රිය සේවා පුණරුත්ථාපන කොළඹ ගාල්ල අධිවේගී මහා මාර්ග හා කටුනායක අධිවේගී මහා මාර්ගය ඉදිවීම, ආදිය වර්තමාන ආර්ථිකය ඉහළ නැංවීමට හේතු වූ කරුණු වේ. රටේ ස්ථාවර සාමය උදා වීම සංචාරක අංශයේ හා සන්නිවේදන අංශයේ පුළුල් වීම කෙරෙහි වාසිදායකව බලපා ඇති බවට පෙනී ගොස් ඇත.

ආර්ථික වර්ධනයත් දේශීය කර්මාන්ත අංශයෙහි සිදු වූ දියුණුවත් හේතුවෙන් අප සමාගමට වාසිදායක තත්ත්වයක් උදා විය. ලංකාවේ උතුරෙහි ජලය පිරිසිදු කිරීමට අවශ්‍ය මධ්‍යස්ථාන පුළුල් වීම හේතුවෙන් ද කුඩා කර්මාන්ත අංශයෙහි සිදු වූ දියුණුව හේතුවෙන් ද අප සමාගමේ ලාභය වැඩි කර ගැනීමට හැකි විය.

සමාගමේ කටයුතු පිළිබඳ සමාලෝචනය

සමාගමේ 2013 මුදල් වර්ෂය සඳහා වන විකුණුම් ආදායම 2012 මුදල් වර්ෂයට වඩා මඳක් අඩු විය. එහෙත් අලෙවි රසායනවල පිරිවැය අඩු කර ලබා ගැනීමට හැකිවීම නිසාත්, ආයතනයේ වෙනත් ආදායම් එනම් ප්‍රධාන වශයෙන් මුදල් තැන්පත් සඳහා ලැබුණු පොලී ආදායම වැඩි වීම නිසාත් ශුද්ධ ලාභය වැඩිකර ගැනීමට හැකි විය. 2013 වර්ෂයේදී බදුවලට පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 37.16 වු අතර එය 2012 වර්ෂයට සාපේක්ෂව 15.6% ක වර්ධනයකි. නමුත් බදු ගෙවීමෙන් පසු 2013 වර්ෂයේ ලාභය 2012 වර්ෂයට වඩා අඩුවී ඇති අතර එය ආදායම් බදුවලින් 2012 වර්ෂයේදී ලද සහනය හේතුවෙන් සිදුවු කරුණකි.

සමාගම 2013 වර්ෂයේ දී ද ලාභ ඉපැයීමට සමත් වුවත් අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ මා සඳහන් කළ පරිදි 2012 අප්‍රේල් 20 වන දා සිදු වූ ක්ලෝරීන් කාන්දු වීම හේතුවෙන් කළුතර පිහිටි ක්ලෝරීන් පිරවුම් මධ්‍යස්ථානය වැසීමට සිදු විය. ප්‍රදේශවාසීන්ගේ හා දේශපාලකයින්ගේ විරෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් ක්ලෝරීන් පිරවුම් මධ්‍යස්ථානය හොරණට රැගෙන යාමටත් එය කොන්ත්‍රාත්කරුවෙකු වෙත බාර දීමටත් සිදු විය. එසේ බාර දීම හේතුවෙන් සිදු වූ අතිරේක වියදම රුපියල් මිලියන 5.8 ක් පමණ වේ. 2013 දී ක්ලෝරීන් නැවත පිරවීමේ කාර්යය රජයේ හෝ පෞද්ගලික ඉඩමක් ආයතනයට ලබා ගෙන නැවත ක්‍රියාත්මක කරවීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක විය. ගරු ඇමති තුමාටත් අතිගරු ජනාධිපතිතුමාටත් ආයතනය මුහුණ දී ඇති තත්ත්වය මා විසින් දැනුම් දීමට කටයුතු කරන ලදී. ක්ලෝරීන් පිරවීමේ කාර්යයත්, අනෙකුත් රසායන නිෂ්පාදන කටයුතුත් කළුතර භූමියෙහි ආරම්භ කිරීමේ සැලැසුම් කර තිබුණද ජනතාවගේ විරෝධය හේතුවෙන් එම වැඩ පිළිවෙල අසාර්ථක විය. හොරණ පිහිටි කොන්ත්‍රාත්කරුගේ පරිශ්‍රයෙහි සීමිත ඉඩකඩ හේතුවෙන් නව නිෂ්පාදන සාර්ථකව සිදු කරගැනීමට සමාගමට නොහැකි විය. එම උත්සාහයන් සාර්ථක වුණේ නම් සමාගමට අතිරේක ආදායමක් උපයා ගැනීමට ඉඩ තිබිණි. 2013 වර්ෂයේ අගභාගයේ දී හොරණ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත කලාපයෙන් අක්කර 2 ½ ඉඩමක් අවුරුදු 30කට බදු පදනම මත ලබා ගැනීමට හැකි විය. එහි සංවර්ධන කටයුතු අවසන් කිරීමෙන් පසු ප්‍රදේශවාසීන්ගේ බාධා කිරීම්වලින් තොරව ක්ලෝරීන් නැවත පිරවීම් කටයුතුවලට අමතර ව අනෙකුත් නිෂ්පාදන ද නව ස්ථානයට මාරු කළ හැකි බවට විශ්වාස කරන්නෙමු.

ක්ලෝරීන් භාවිතයේ දී ඇති අවදානම සැලකිල්ලට ගෙන ක්ලෝරීන් ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, නැවත පිරවීම හා පාරිභෝගිකයින්ට නිකුත් කිරීම ආදී කටයුතු විධිමත් කිරීමට සැලැසුම් කර ඇත. ක්ලෝරීන් භාවිතයේ දී අනතුරු ඇතිවිය හැකි අවස්ථා හඳුනාගෙන අන්තර්ජාතික තත්ත්වයන්ට අනුකූල ව ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ආයතනය විසින් ක්ලෝරීන් පරිහරණය වන සම්පූර්ණ ක්‍රියාවලියම ආවරණය වන පරිදි ඉන් තුන් වන පාර්ශවයකට සිදුවිය හැකි හානි වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 100 ක රක්ෂණ ආවරණයන් ලබාගෙන ඇත.

සමාගමේ ප්‍රධානතම ආදායම වන්නේ දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආදිය වෙළෙඳපොලට නිකුත් කිරීමෙන් ලබන ආදායමයි.

ක්ලෝරීන් නිෂ්පාදන කර්මාන්තශාලාව පරන්තන්හි ස්ථාපිත කිරීමේ මූලික සැලසුම් දැනට සිදු වේ. අනාගතයේ දී ඇමෝනියා හා සල්පියුරික් අම්ලය වැනි රසායන ද්‍රව්‍ය ආනයනය කර විකිණීමට සුදුසු වෙළෙඳපොලක් තිබේ ද යන්න පිළිබඳ ව සමාගම දැනට අධ්‍යයනය කරමින් සිටියි.

අධ්‍යක්ෂ මණ්ඩලය

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂතුමා ඇතුලු අධ්‍යක්ෂවරු හයදෙනෙකුගෙන් සමන්විත විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ 15 පිටුවෙහි අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂය තුළ සමාගමේ කටයුතු සතුටුදායක ලෙස ඉදිරියට ගෙන යාම සඳහා මාගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අතිමහත් සහයක් ලද බවද මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි.

මූල්‍ය ක්‍රියාකාරිත්වය

විගණනය කරන ලද ගිණුම්වලට අනුව සමාගමේ බදු පූර්ව ලාභය වශයෙන් රුපියල් මිලියන 37.16 ක් සහ බදු පසු ශුද්ධ ලාභය වශයෙන් රුපියල් මිලියන 31.06 උපයා ඇත. මෙම වර්ෂයේ වෙළෙඳ කටයුතු දියර ක්ලෝරීන් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ආනයනය කර විකුණුම්වලට සීමා විය.

යෝජිත පරන්තන් කර්මාන්තශාලා භූමියේ සිදු කරන ලද සංවර්ධනය

1956 දශකයේ සිට ක්‍රියාත්මක වූ පරන්තන් රසායන කර්මාන්තශාලාව 1985 වර්ෂයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිසා වසා දමන තෙක් අඛණ්ඩව පැවති කර්මාන්තශාලාවකි. මෙම කර්මාන්තශාලාවෙන් දේශීය වෙළඳපොලට අවශ්‍ය දියර ක්ලෝරීන් කෝස්ටික් සෝඩා දියර, හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ප්‍රධාන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ් පෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු අතුරු නිෂ්පාදන වශයෙන් ද නිෂ්පාදනය කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් පරන්තන් රසායන කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම ප්‍රමුඛතම කාර්යයක් වශයෙන් හඳුනාගෙන ඇත. පරන්තන් කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන 3000 ක් පමණ වැය වන බවට ඇස්තමේන්තු කර ඇති අතර එම ආයෝජනය රජයෙන් ලබා ගැනීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන ලදි. එම සාකච්ඡාවට අනුව එම මුදල් රජයෙන් ලබා දීමට අපහසු බව අපහට දැනුම් දී ඇත. දේශීය හෝ විදේශීය ආයෝජකයෙකු මගින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර පරන්තන් රසායනික කර්මාන්තශාලාව සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කරන ලුණු ඊට ආසන්නයේ පිහිටා ඇති අලිමංකඩ ලුණු ලේවායෙන් ලබා ගැනීම සැලසුම් කර තිබුණ ද මේ වන විටත් එම ලුණු ලේවායේ නිෂ්පාදන කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලව ආරම්භ කිරීමේ වැඩ කටයුතු ප්‍රමාද වී ඇත.

කෝස්ටික් සෝඩා ව්‍යාපෘතිය මගින් ලැබෙන අතුරුඵලයක් වන අතිරික්ත ක්ලෝරීන් මනාව පාලනය කිරීම වැදගත්ය. මේ සඳහා ඩයිකැල්සියම් පොස්පේට් වැනි ව්‍යාපෘතියක් එකතු කිරීම තුළින් නිෂ්පාදිත ක්ලෝරීන්වලින් 70% පමණ එම ව්‍යාපෘතියට අන්තර්ගත කිරීමට අවශ්‍ය අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ සාම්ප්‍රදායික ස්වරූපය දේශීය ඉල්ලුම අනුව සිදු කිරීමට බ්ලීචින් පවුඩර්, කෝස්ටික් සෝඩා වැනි දේ නිෂ්පාදනය කිරීමේ හැකියාව ලැබීම තුළින් මෙම ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස මම සිතමි.

පරන්තන් කර්මාන්තශාලාව පිහිටි භූමියේ වටප්‍රමාණය අක්කර 227 ක් වන අතර මේ වන විට එම භූමියේ වෙන්කරන ලද අක්කර 20 ක භූමි ප්‍රමාණයක වාණිජමය වශයෙන් වටිනා ශාක සිටුවීමට කටයුතු කර ඇත.

මේ වන විට පරන්තන් රසායනික කර්මාන්තශාලාව පිහිටි භූමියේ හමුදා කඳවුරක් පිහිටා ඇති අතර එම ඉඩමෙහි අසල්වාසීන් විසින් අනවසරයෙන් පදිංචි වී ඇති අතර සිදු කරනු ලබන වගා කටයුතු නතර කරන ලෙසට යුද හමුදාව හරහා දැනුම් දී ඇත. පරන්තන් රසායනික කර්මාන්තශාලාවෙහි වැඩ කටයුතු අලිමංකඩ ලුණුලේවාය ආරම්භ නොකිරීම හේතුවෙන් ප්‍රමාද වන නිසා දියර ක්ලොරීන් සහ දිය ගැසූ හුණු භාවිතයෙන් බ්ලීචින් කුඩු නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අප විසින් තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන අනූවක් පමණ වැය වන බවට ඇස්තමේන්තු කර ඇත.

බ්ලීචින් කුඩු ව්‍යාපෘතියට අමතර ව දැනට කොන්ත්‍රාත් පදනම මත සිදු කරනු ලබන ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු ආයතන භූමියක සමාගමේ පාලනය යටතේ සිදු කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මනා ආරක්ෂණ තත්ත්වයන් සහිතව නැවත පිරවුම් ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටි. අප ආයතනය සතු කන්ටේනර් රථයක් මගින් ප්‍රවාහන කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති අතර එමගින් මුදල් ඉතිරියක් අපේක්ෂා කෙරේ.

සමාගමේ අනාගතය

ඉදිරි කාලයේදී සැලකිය යුතු වර්ධනයක් ඇති කර ගැනීමට බලාපොරොත්තු වන අතර 2013 වර්ෂයේ දී ලබා ගත් ප්‍රගතිය ද ඉතා හොඳ මට්ටමක පවතී.

විගණන මතය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය වන්නේ, 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 වැනි දිනට සමාගමේ තත්ත්ව විස්තරය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

නීතිමය සහ වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිබඳ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 වැනි වගන්තියට අනුකූල බව විගණන මතයයි.

පිරිනැමීම

මාගේ රාජකාරි කටයුතු සහ වගකීම් ඉටුකිරීමේ දී සමාගම වෙත හා මා හට ලබා දුන් අනුපමේය සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අමාත්‍යතුමාට, රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාට, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගමට, අභ්‍යන්තර විගණක කේ. ලියනගේ සහ සමාගමට මගේ කෘතඥතාවය පලකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. තවද මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ද, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ද සියලුම සේවකයින්ටද ඔවුන්ගේ අපරිමිත කැපවීම හා ආයතනය කෙරෙහි ඇති ලැදියාව මෙවන් උසස් ආකාරයේ ප්‍රතිඵල ලබාගැනීමට දායක වූ බව මතක් කරමින් මාගේ කෘතඥතාවය ඔවුන් වෙත පුදකරමි.

එමෙන්ම ආයතනයේ යහ පැවැත්මට අපගේ ගනුදෙනුකාර භවතුන්ගෙන් ලත් ඉමහත් සහයෝගය අගයකරන අතර, 2013 වසරේ දී ලබා දුන් සහය 2014 වසරේ දී ද එලෙසින්ම ලබා දෙන මෙන් ඉල්ලමි.

ඩී. ජේ. යූ. පුරසිංහ
සභාපති
පරන්තන් කෙමිකල්ස් සමාගම
2014 මැයි 28.

සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

2013 වර්ෂයේ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය අලෙවි කිරීමට පමණක් සීමා විය. අධ්‍යයනය සිදු කෙරෙන මෙම වර්ෂයේ සමාගමේ ආදායම රුපියල් මිලියන 209.18 ක් වේ. මෙය පසුගිය වර්ෂයට වඩා මඳක් අඩු ය. එහෙත් රුපියල් මිලියන් 37 ක් බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් ඉපැයීමට සමාගමට හැකියාව ලැබුණු අතර මෙය පසුගිය වර්ෂයට වඩා යහපත් තත්ත්වයකි. භාණ්ඩවල පිරිවැය අඩු වීම, වෙනත් කටයුතු මගින් ලත් ආදායම ඉහළ යාම, හා සිලින්ඩර් තත්ත්ව පරීක්ෂා කිරීම හා නඩත්තු කිරීම සඳහා අඩු ගාස්තුවක් ගෙවීම යන කරුණු මීට හේතු වූ බව හඳුනාගෙන ඇත.

මෙම වර්ෂයේ දී ආයතනය ලබා ගත් සමස්ත ආදායම මෙන් වැඩිම ආදායම දියර ක්ලෝරීන් අලෙවි කිරීම මගින් ලබා ගෙන ඇත. කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ල අලෙවි කිරීම මගින් අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට නොහැකි විය. වෙළඳපොලෙහි මෙම රසායන අඩු මිලට ලබා ගත හැකි වීම නිසා උදා වුණු තරඟකාරීත්වය මෙම පසුබෑමට හේතු විය.

2012 අප්‍රේල් 20 වන දා කළුතර සිදු වූ ක්ලෝරීන් කාන්දු වීම හේතුවෙන් නව නිෂ්පාදන ආරම්භ කර ගැනීමට සමාගමට නොහැකි විය. දියර ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු සමග නව නිෂ්පාදන ආරම්භ කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ සහිත ඉඩමක් සොයාගැනීම දුෂ්කර විය. එබැවින් පෙර සැලසුම් කළ පරිදි බ්ලීච්ං පවුඩර් හා බ්ලීච්ං දියර 2013 වර්ෂයේ දී නව නිෂ්පාදන වශයෙන් ආරම්භ කිරීමට නොහැකි විය. හොරණ කොන්ත්‍රාත්කරුවෙකුගේ මධ්‍යස්ථානයෙහි බ්ලීච්ං දියර සීමාසහිත ප්‍රමාණයක් පමණක් නිෂ්පාදනය කෙරිණි. එහි පවා ඉඩ පහසුකම් අඩු වීම හේතුවෙන් එම කාර්යය පුළුල් කිරීමට නොහැකි විය. ක්ලෝරීන් නැවත පිරවුම් කාර්යය සඳහා සමාගම සතු ඒකකයක් නැවත ස්ථාපිත කිරීමටත් නිෂ්පාදනය වැඩි කිරීමට අනෙකුත් නිෂ්පාදන එම භූමියේ ස්ථාපිත කිරීමටත් අපේක්ෂා කෙරේ.

කළුතර සිදු වූ ක්ලෝරීන් කාන්දු වීමේ සිද්ධියෙන් පසු ක්ලෝරීන් ආනයනය කිරීමේ පටන් එය පාරිභෝගිකයන් පරිභෝජනය කරන තෙක් ක්ලෝරීන් භාවිත කිරීමේ දී අනතුරු ඇති විය හැකි කරුණු පිළිබඳ සමාගම ගැඹුරු අධ්‍යයනයක යෙදිණි. එහිදී අනතුරු ඇති වීමේ අවස්ථාවන් හා ඒ සම්බන්ධයෙන් ගත යුතු ආරක්ෂිත පියවරවල් හඳුනා ගැනිණි. ක්ලෝරීන් ආරක්ෂිතව පරිහරණය සම්බන්ධයෙන් විශේෂඥවරුන්ගෙන් උපදෙස් ලබා ගන්නා ලද අතර විදේශ රටවල මෙවැනි කර්මාන්තශාලා වෙත ගොස් ක්ෂෙත්‍ර අධ්‍යයනයක් පවා කෙරිණි. රසායන ඉංජිනේරුවන්ටත් ආයතනයේ සේවකයින්ටත් මේ පිළිබඳ ව නිපුණතා පුහුණුවක් ද ලබා දී ඇත.

ක්ලෝරීන් කි.ග්‍රෑ. 900 යේ සියලු සිලින්ඩර ගැනුම්කරුවන්ට නිකුත් කිරීමට පෙර විධිමත් ජාත්‍යන්තර තත්ත්වයන්ට අනුකූලවත් පරීක්ෂා කරනු ලැබේ. රට තුල නැවත පුරවන ලද කිලෝග්‍රෑම් 68 සිලින්ඩර මෙරටදීම පරීක්ෂාවට ලක් කෙරේ. ක්ලෝරීන් භාවිතයේ දී සිදු විය හැකි සියලු විපත්වලදී මහජනයාට වන්දි ගෙවීමට හැකි වන පරිදි සමාගමේ රක්ෂණ ආවරණය රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 100 දක්වා වැඩි කර ඇත. එමෙන්ම ක්ලෝරීන් භාවිතය පිළිබඳ ව සමාගමේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ටත් බස්නාහිර පළාතේ හා දකුණු පළාතේ ජලාපවහන මණ්ඩල සේවකයින්ටත් පුහුණු සැසි පවත්වා ඇත. කුලියාපිටියේ දී පවත්වන ලද 'දැයට කිරුළ ' ප්‍රදර්ශනයේ දී ආයතනයේ ප්‍රදර්ශන භූමියේදී මේ සම්බන්ධව විස්තර පළකරන ලදි.

මූල්‍ය අංශය

සමාගමෙහි මූල්‍ය අංශයේ නායකත්වය දරන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියකි. එහි විධායක නිලධාරීවරුන් දෙදෙනෙකු ද කළමනාකාර සහකාරවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ. සමාගමේ මූල්‍ය අංශය කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන පිළිබඳ ක්‍රමෝපායන් සැලසුම් කිරීමටත් සමාගමේ සැලසුම් සකස් කිරීමටත් දායක විය. සමාගම ළඟා කර ගත් දියුණුව පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයටත්, ගරු ඇමතිතුමාටත්, මහා භාණ්ඩාගාරයටත් වාර්තා කිරීම මූල්‍ය අංශය නිසි කලට සිදු කළ බව සඳහන් කිරීමට කැමත්තෙමි. ආයතනයේ

අභ්‍යන්තර මූල්‍ය පාලනය මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය අංශය මෙහෙය වීමටත් මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම මගින් ආයතනයේ සමස්ත ප්‍රතිඵලවලට දායකත්වයක් ලබාදෙන ලදි.

අලෙවිකරණ අංශය

සමාගමේ අලෙවිය හා බෙදා හැරීම් ආදී ක්‍රියාකාරකම් මෙහෙයවනු ලබන්නේ අලෙවි අංශයෙනි. අලෙවි අංශයේ නායකත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියක විසින් දරනු ලබයි. කළමනාකාර සහකාරවරු මෙම කාර්යයන්ට දායකත්වය දක්වති. දේශීය වශයෙන් ක්ලෝරීන්, කොස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආදිය අලෙවි කරනු ලබන්නේ මෙම අංශයෙනි. ඉහත නිෂ්පාදනවලට ඇති පාරිභෝගික ඉල්ලුම විධිමත් අන්දමින් අධ්‍යයනයට ලක් කර අපේක්ෂිත තොග විධිමත් ව පවත්වාගනු ලැබේ. ඉහත භාණ්ඩවලට වෙළඳපොල පවතින මිල ගණන් නිරීක්ෂණයට ලක් කෙරෙන අතර ඊට ගැළපෙන පරිදි සමාගමේ මිල යාවත්කාලීන කෙරේ.

සැපයුම් අංශය

සමාගමේ මිලදී ගැනීම් සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් සැපයුම් අංශය මගින් සිදු කරනු ලබයි. මෙම අංශය සහකාර සාමාන්‍යාධිකාරිවරියකගෙන්, විධායක නිලධාරිනියකගෙන් සහ කළමනාකාර සහකාරවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. සලකා බලන වර්ෂය තුළ දී මෙම අංශය විසින් සැපයුම්කරුවන් ගෙන් මිල ගනන් අවම කර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇති අතර එය සමාගමේ ලාභදායිත්ව වර්ධනයට ධනාත්මක ලෙස බලපා ඇත.

පරිපාලන අංශය

සමාගමේ ඉතා විශාල අංශවලින් එකක් වන පරිපාලන අංශයෙහි සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 22කි. මෙම අංශයෙහි ප්‍රධානියා වශයෙන් කටයුතු කරන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියකි. එම අංශයෙහි සේවය කරන විධායක නිලධාරිවරුන්ගේ සංඛ්‍යාව 4ක් වන අතර කළමනාකාර සහකාරවරුන් 5 දෙනෙකි. එමෙන්ම එහි සිටින ශ්‍රමික හා ක්‍රියාකාරකම් සේවකයින්ගේ සංඛ්‍යාව 16කි. සමාගමේ සමස්ත පරිපාලන ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබන්නේ මෙම අංශය මගිනි. සේවකයින්ගේ නීත්‍යානුකූල ගෙවීම්, දිනපතා පැමිණීම, සුභසාධනයට අදාළ ලිපි සැකසීම, ලිපි හුවමාරුව, සම්බන්ධීකරණය කිරීම, ප්‍රවාහන කටයුතු මෙහෙයවීම හා සමාගම පවත්වාගෙන යනු ලබන සතු ගොඩනැගිලි - පරිශ්‍රය නඩත්තු කිරීම ආදිය මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

නැවත පිරවුම් ඒකකය - කළුතර

කළුතර පිහිටි ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුගෙන් (ඉංජිනේරු), රසායන ඉංජිනේරුවරයෙකුගෙන්, විධායක නිලධාරිවරයෙකුගෙන්, කළමනාකාර සහකාරවරුන් සයදෙනෙකුගෙන් සහ කාර්ය සහායක සේවකයින් දාහතර දෙනෙකුගෙන් සමන්විත වේ. 2013 වසර තුළ දී මෙම ඒකකයේ ක්‍රියාත්මක වීම සතුටු දායක විය. එහෙත් 2012 අප්‍රේල් 20 වැනි දින සිදු වූ ක්ලෝරීන් කාන්දු වීමේ අනතුරෙන් පසු ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු කොන්ත්‍රාත් පදනම යටතේ සිදු කර ගැනීම සඳහා හොරණ ප්‍රදේශයේ පෞද්ගලික

කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙන යන ලදී. වඩාත් පහසුකම් සහිත ව මෙම ඒකකය පිහිටුවා පවත්වාගෙන යාමට සුදුසු ස්ථානයක් සමාගම මේ වන විට ලබාගෙන ඇති අතර එහි සංවර්ධන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

එස්. අනුර සිරිවර්ධන
සාමාන්‍යාධිකාරි
පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
2014 මැයි 28

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
කළුතර සහ හොරණ කාර්ය මණ්ඩලය - 2013

වමේ සිට දකුණට

පළමු වන පේළිය
එච්. ඩී. ආර්. වයි. හේවාදේව මිය, එල්. ලියනගේ මයා, එල්. ඩී. ආර්. ඩී. ගෝකුල මයා.

දෙවන පේළිය
එම්. ඩී. එස්. අජන්ත මිය, ආර්. ඒ. අබේසිංහ මිය, ජී. ආර්. ධම්මික මයා, ඊ. ඒ. එම්. ජේ. එදිරිසිංහ මයා, එච්. ඒ. විමලසේන මයා, පී. වී. සචිත් සාලින්ද මයා, එච්. බී. පියසිරි මයා, එස්. ඒ. කේ. කුමාර මයා.

තුන් වන පේළිය
ඒ. වී. කීර්ති පියදේව මයා, ජී. ආර්. වීරසේන මයා, පී. එන්. විජේකුලසූරිය මයා, එම්. මොරමුදලි මයා, කේ. කේ. විශ්වජිත් මයා, ඩබ්ලිව්. ඩී. ජගත් කුමාර මයා, බී. කේ. චමින්ද මයා, ආර්. ඩබ්ලිව්. කුමාර මයා, ඩී. ඒ. පී. එස්. බණ්ඩාර මයා, එච්. ටී. ජී. කේ. වික්‍රමසූරිය මයා, ප්‍රේමලාල් සිල්වා මයා, ඩී. පැට්සන් මයා.

2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව

පරන්තන් කෙමිකල්ස් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය, 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව, ගිණුම් සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයන් මේ සමග ඉදිරිපත් කරයි.

හැඳින්වීම

ව්‍යාපාර කටයුතු ඉදිරියට කර ගෙන යාම පිණිස 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන, රාජ්‍ය සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාව, රජයට අයත් සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1991.01.17 වැනි දින සංස්ථාපිත කැරිණි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා ඝන සහ පතුරු සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආනයනය කර අලෙවි කිරීම සහ කළුතර ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකයේදී කි.ගෑ. 900 සිලින්ඩර්වලින් කි.ග්‍රෑ. 68 ධාරිතාවේ සිලින්ඩරවලට දියර ක්ලෝරීන් නැවත පිරවීම, ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

ව්‍යාපාර සමාලෝචනය

සමාගමේ වර්ෂයේ මෙහෙයුම පිළිබඳව, සභාපතිතුමාගේ ප්‍රකාශනයේ විස්තර වශයෙන් දැක්වේ. මෙය අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්තාවේ කොටසක් හා සම්බන්ධ වේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලය

වර්තමාන අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. ආචාර්ය ඩී.ජේ.යූ. පුරසිංහ මහතා - සභාපති සහ අධ්‍යක්‍ෂ (විධායක)
2. ආනන්ද ජයසිරි ගමගේ මහතා - විධායක අධ්‍යක්‍ෂ
3. එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා - අධ්‍යක්‍ෂ (විධායක නොවන)
4. මායලඝු ශෂිකරන් මහතා - අධ්‍යක්‍ෂ (විධායක නොවන)
5. එච්.ඒ.එන්.එස්.කුමාර මහතා - අධ්‍යක්‍ෂ (විධායක නොවන) (පත්වීම : 2013.09.17 සිට)
6. බී.ජී. ගුණවර්ධන මහතා - අධ්‍යක්‍ෂ (විධායක නොවන) (පත්වීම : 2013.06.24 සිට)
7. ජේ.ඩී.ඒ. විශ්වමිත්‍ර මහතා - අධ්‍යක්‍ෂ (විධායක නොවන) (පත්වීම : 2013.06.24 සිට)

අධ්‍යක්‍ෂ මණ්ඩලය සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් පස් දෙනෙකු විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් වෙයි. විධායක නොවන අධ්‍යක්‍ෂ ඩී.එම්.පී.ඒ. දසනායක මහතා 2013. ජුනි 24 වැනි දින සිට බලපවත් වන පරිදි විශ්‍රාම ලැබුවේය. විධායක නොවන අධ්‍යක්‍ෂ පී.සරත් කුමාර මහතා (භාණ්ඩාගාර නියෝජිත) 2013 සැප්තැම්බර් 17 වැනි දින විශ්‍රාම ලැබුවේ ය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගම මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ අතර, අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා ඇත. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා තිබේ.

<u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධයක්‍ෂවරුන්ගේ සහභාගිත්වය - 2013</u>

අධ්‍යක්ෂවරුන්ගේ නම්	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
ආචාර්ය ඩී.ජේ.යූ. පුරසිංහ මහතා (සභාපති - අධ්‍යක්ෂ - විධායක)	12
ආනන්ද ජයසිරි ගමගේ මහතා (විධායක අධ්‍යක්ෂ)	11
එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	10
බී.ජී. ගුණවර්ධන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	05
එච්.ඒ.එන්.එස්. කුමාර මහතා (විධායක නොවන අධ්‍යක්ෂ) පත්වීම 2013.09.17 සිට	03
මායලඝු ශෂිකරන් මහතා (විධායක නොවන අධ්‍යක්ෂ) පත්වීම 2013.06.24 සිට	07
ඩී.එම්.පී.ඒ. දසනායක මහතා (විධායක නොවන අධ්‍යක්ෂ) (2013.06.27 සිට	06
සරත් කුමාර මහතා (විධායක නොවන) (2013.09.17 සිට විශ්‍රාම)	08
ජේ.ඩී.ඒ.විශ්වමිත්‍ර මහතා (විධායක නොවන අධ්‍යක්ෂ) පත්වීම 2013.06.24 සිට	06

කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ආචාර්ය ඩී.ජේ.යූ. පුරසිංහ මහතා, ඒ.ජේ. ගමගේ මහතා, එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා, එච්.ඒ.එන්.එස්. කුමාර මහතා, එම්. ශෂිකරන් මහතා, ජේ.ඩී.ඒ. විශ්වමිත්‍ර මහතා, බී.ජී. ගුණවර්ධන මහතා යන අය 2013 දෙසැම්බර් 31 දක්වා සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළහ. ඩී.එම්.පී.ඒ. දසනායක මහතා හා සරත් කුමාර මහතා යන අය පිළිවෙලින් 2014 ජුනි 27 - 2013 සැප්තැම්බර් 17 යන දිනවල අධ්‍යක්ෂ තනතුරෙන් විශ්‍රාම ලැබූහ. ආයතනය සමග සෘජු සේවා හෝ වක්‍ර ආකාරයේ ඇල්මක් නොපැවති බව ඔවුන් සනාථ කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී අදාළ වන නීති සහ වෙනත් රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ.

මූල්‍ය තත්වය අනාවරණය වන අයුරින් සාධාරණ නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ ගිණුම් වාර්තා පවත්වා ගැනීමෙහිලා අධ්‍යක්ෂවරු සමාන ලෙස වගකිව යුතු වේ.

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්හි අඛණ්ඩ පැවැත්ම සහ විෂය මූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරු භාර ගන්නා අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන නීති අනුගමනය කැරෙන බවද ස්ථිර කරති.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කෙරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්.
- නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන අනුරූපව යොදා ගැනීම.
- මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය සහ පැහැදිලි මතයක් පිළිබිඹු වීම පිණිස විචක්ෂණ සහ සාධාරණ පදනමක් මත මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වන ඇස්තමේන්තු සහ විනිශ්චයන්.

වත්කම් ආරක්ෂා කර ගැනීමෙහිලා සමාගම විසින් නියමිත, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය කිරීම් සහ ගිණුම් වාර්තා යොදා ගෙන ඇත. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කෙරුණු යෝජනාවකට අනුකූලව සමාගමේ බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගම යලි පත් කෙරිණි. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ ඔවුන්ගේ මතය දැක්වීම පිණිස උචිත බවට ඔවුන් විසින් සැලකිල්ලට ගන්නා ලද අවශ්‍ය පිරික්සා බැලීම් කර ගෙන යෑම සඳහා, නිදහස් ප්‍රවේශයන් ඔවුන් වෙත සැපයිණි. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව ඔවුන්ගේ වගකීම්, පසුව එන පිටුවේ දැක්වෙන විගණක වාර්තාවේ විදහා පෙන්වයි.

අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය

අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව පවත්වාගෙන යනු ලබයි.

අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන

2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය, මූල්‍ය ප්‍රකාශනයන්හි 4 වැනි සටහනේ දැක් වේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ආනයන බදු, තීරු බදු ආදිය ගෙවීමෙන් කෙරෙන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින්ට අදාළ වන ව්‍යවස්ථාපිත ගෙවීම්, තම උපරිම දැනීමේ සහ විශ්වාසයේ හැටියට, සමාගම විසින් නිසි පරිදි ගරු කර ඇති බවට සමාගමේ අධ්‍යක්ෂවරු සෑහීමට පත් වෙති.

දේපල යන්ත්‍රාගාර සහ උපකරණ

සමාලෝචිත වර්ෂය තුල දේපල, යන්ත්‍රාගාර සහ උපකරණවල සැලකිය යුතු වෙනස්වීම්, ගිණුම් 42 සහ 43 පිටුවල 8 වැනි සටහනේ දැක්වේ.

ලාභාංශ ගෙවීම්

2012 වර්ෂය සඳහා රු. මිලියන 5 ක ලාභාංශයක් සමාගම ගෙවා ඇත.

විගණකවරයා

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ විගණකවරයා, වරලත් ගණකාධිකාරිවරු වන හේමචන්ද්‍ර සහ සමාගම විය.

වර්ෂය සඳහා විගණක ගාස්තු වශයෙන් රු. 66,300.00 ක් ප්‍රතිපාදනය කර ඇත. තම නිදහසට හානි වනු ඇති කිසිදු සම්බන්ධතාවයක් හෝ කිසිදු ඇල්මක් විගණකවරුන් විසින් සමාගම සමඟ පවත්වා නොමැත.

ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරීක්ෂණය

ලාභාංශය යෝජනා කළ වහාම අධ්‍යක්ෂවරුන් විසින් සමාගම සතුව ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට තක්සේරු කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතෙන් නියමිත ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරික්ෂණය සමාගම විසින් සපුරා ඇති බව ස්ථිර කර ඇත.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, (28) වැනි පිටුවේ සිට (34) වැනි පිටුව දක්වා සඳහන් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ, සමාගම විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු වී නොමැත.

යෝජිත අවසන් ලාභාංශ

2013 වර්ෂය සඳහා රු. මිලියන 4.5 ක ලාභාංශයක් යෝජනා කරන ලදුව සම්මත විය.

කොටස් වටිනාකම් ලේඛනය

2007 වර්ෂයේ සමාගම් පනතේ අංක 7 වගන්තිය ප්‍රකාර 2011 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද හිමිකම් ලේඛනය, 2013 වර්ෂය තෙක් අඛණ්ඩ ව පවත්වා ගන්නා ලදි.

අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්

2013 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂයේ දී සමාගමේ අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද වැටුප් පිළිබඳ කරුණු මූල්‍ය වාර්තාවේ 4 වන සටහනෙහි දැක්වේ.

නිත්‍යානුකූල ගෙවීම්

රජයට ගෙවීමට නියමිත නීත්‍යානුකූල ගෙවීම් ද සේවකයින්ට ගෙවීමට නියමිත ගෙවීම් ද සමාගම නිසි පරිදි ගෙවා තිබීම පිළිබඳ ව තමන්ගේ දැනුවත් වීම හා විශ්වාසය ගැන අධ්‍යක්ෂවරු සෑහීමට පත් වෙති.

දේපළ - යන්ත්‍රාගාර සහ උපකරණ

සමාලෝචිත වර්ෂය තුළ දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණවලට සැලකියයුතු ගිණුම් සඳහා 42 සහ 43 පිටුවල 8 වැනි සටහනේ දැක්වේ.

ලාභාංශගෙවීම්

2012 වර්ෂයේ සමාගම විසින් ලාභය වශයෙන් උපයා ගත් රුපියල් මිලියන් 05 ක මුදලක් බෙදා දෙන ලදි.

යෝජිත කොටස් ලාභ මුදල

2013 ගිණුම්කරණ වර්ෂය සඳහා වූ කොටස් ලාභ මුදල වශයෙන් රුපියල් මිලියන 4.5 ක් ගෙවීමට යෝජනා කරනු ලදුව සම්මත විය.

විගණකවරයා

විගණනය සිදු කෙරෙන වර්ෂයේ අදාළ විගණනය සිදු කරන ලද්දේ හේමචන්ද්‍ර සහ සමාගමේ වරලත් ගණකාධිකාරිවරුන් විසිනි. එම වර්ෂයේ ගිණුම්කරණ ගාස්තු වශයෙන් රුපියල් 66,300,00 ක් ගිණුමෙහි වෙන්

කරන ලදි. එම ගණකාධිකාරිවරුන්ගේ නිදහසට බලපෑම් එල්ල කිරීමේ සම්බන්ධතාවයක් හෝ වෙනත් ආකාරයේ ප්‍රතිලාභයක් හෝ සමාගමේ ගණකාධිකාරිවරුන්ට නොතිබිණි.

ණය ගෙවීමේ ශක්තියට අදාළ පරීක්ෂණය

යෝජිත කොටස් ලාභ බෙදා දීමෙන් පසු ණය ගෙවීමේ ශක්තියක් සමාගමට තිබේද යන්න ඇගයීමට ලක් කළ අධ්‍යක්ෂ මණ්ඩලය 2007 වර්ෂයේ සමාගම් පනතේ 7 වන වගන්තියට අනුකූල ව එම පරීක්ෂණයෙන් පසු සමාගම ගැන තමන් තෘප්තියට පත්වන බවට අධ්‍යක්ෂවරු සහතික කළහ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 30 වැනි පිටුවේ සිට 38 වැනි පිටුව දක්වා සඳහන් කර ඇත. සමාලෝචිත වර්ෂය තුල, සමාගම විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු වී නොමැත.

අනාගතය පිළිබඳ පෙර දැක්ම

අනාගතය පිළිබඳ 'මහින්ද චින්තන' පෙර දැක්ම යථාර්තයක් බවට පත් කරමින් පරන්තන් ක්ලෝරින් කර්මාන්තශාලාව යළි නගා සිටුවීම අපගේ දැක්ම වේ.

විගණන කමිටුව

විගණන කමිටුව, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය. අභ්‍යන්තර පාලන පද්ධති, ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශනයන් සහ කළමනාකරණ ගිණුම් පිළිබඳ කාර්යක්‍ෂමතාව සම්බන්ධව විගණන කමිටුව විසින් නිරතුරුවම සමාලෝචනය කරන ලදී.

කෘතඥතාවය

වර්තමාන ප්‍රගමනය කරා ලඟා වීමේහි ලා අප ගැණුම්කරුවන්ගෙන් ලද අනවරත සහාය සහ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද සහයෝගීතාව, කැපවීම සහ දරණ ලද ප්‍රයත්නයන් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අගය කරනු ලැබේ.

ඩී.ජේ.යූ. පුරසිංහ
සභාපති
2014 මැයි 28

එච්.එම්.ආර්. කිරිඇල්ල
අධ්‍යක්‍ෂ

2013 දී ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයේ නැවත පිරවීමේ කාර්යය - පිරිසිදු කිරීමේ කාර්යය - කර්මාන්තශාලා ආරක්ෂිත ක්‍රියාකරකම්

2015 වර්ෂය තුල දී ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියා මාර්ග

2014 වර්ෂයේ දී ආයතනය විසින් රුපියල් මිලියන 264ක ආදායමකුත් රුපියල් මිලියන 27.51 ක් බදු ගෙවීමෙන් පසු ලාභයකුත් අත්කර ගැනීමට සැලසුම් කර අත. අපේක්ෂිත විකුණුම් ලබා ගැනීම සඳහා දියර ක්ලෝරින් අලෙවිය වැඩි කර ගැනීමටත් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ල සඳහා විශේෂ වැඩපිළිවෙලක් යෙදීම මගින් විකුණුම් වැඩි කර ගැනීමටත් සැලසුම් සකස් කර ඇත. මේ අනුව කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ල අඩු පිරිවැය යටතේ ආනයනය කර විකුණුම් වැඩිකර ගැනීමට අපේක්ෂාකරනු ලැබේ.

නව නිෂ්පාදනයන් යටතේ බ්ලීච්ං පවුඩර් ආනයනය කිරීමට සැලැසුම් කර ඇත. දීර්ඝ කාලීන වශයෙන් බ්ලීච්ං පවුඩර් රට තුළ නිෂ්පාදනය කර ගැනීමට හැකි වන පරිදි ඒ සඳහා 2015 වර්ෂයේ නව කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට සමාගම සැලැසුම් කර ඇත. මෙම සැලැස්ම අනුව බ්ලීච්ං පවුඩර් අලෙවියෙන් සමාගමේ අලෙවි ආදායම රු. මිලියන් 106 කින් වැඩිවන බවට අපේක්ෂා කෙරේ. දැනට කොන්ත්‍රාත්කරුවෙකු මගින් ක්‍රියාත්මක කෙරෙන ක්ලෝරීන් පිරවීමේ කාර්යය, 2015 දී පමණ රුපියල් මිලියන 6.24 ක වියදමින් නැවත ආයතනයේ භූමියක ස්ථාපිත කර සමාගම මගින් සිදු කිරීමට සැලසුම් කර ඇත. යෝජිත මෙම සැලැස්ම ක්‍රියාත්මක කෙරෙන්නේ නම් 2015 වර්ෂයේ අතිරේක වියදම් වශයෙන් වැය වන රුපියල් මිලියන හයක් (6) පමණ ඉතිරි කර ගැනීමට හැකි වනු ඇත.

අලිමංකඩ ලුණුලේවායේ වැඩකටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ නිලධාරීන් උනන්දු කිරීමට කටයුතු කර ඇත. ආයතනය විසින් සිදුකිරීමට බලාපොරොත්තු වන කෝස්ටික් සෝඩා - ක්ලෝරීන් ව්‍යාපෘතියට මෙය රුකුලක් වනු ඇත.

සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 13, ශ්‍රී රාමනාදන් මාවතේ අංක 100/25 දරණ ලිපිනයේයි. මෙම පරිශ්‍රය වරාය අධිකාරියට අයත් එකකි. වරාය අධිකාරිය එම ඉඩම හා ගොඩනැගිල්ල නැවත බාර දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු ගොඩනැගිල්ලකි. එමෙන්ම අපගේ වත්මන් කාර්ය මණ්ඩලයට එය ප්‍රමාණවත් නොවේ. එනිසා 2015 වර්ෂයේ දී අපගේ කාර්යාලය ගැළපෙන තැනකට මාරුකිරීම සමාගමේ සැලැස්මයි.

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී අදාළ වන නීති සහ වෙනත් රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ.

මූල්‍ය තත්ත්වය අනාවරණය වන අයුරින් සාධාරණ නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ ගිණුම් වාර්තා පවත්වා ගැනීමේලා අධ්‍යක්ෂවරු සමාන ලෙස වගකිව යුතු වේ.

ඉදිරිපත් කැරෙන මූල්‍ය ප්‍රකාශනයන්හි අඛණ්ඩ පැවැත්ම සහ විෂය මූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරු භාර ගන්නා අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන නීති අනුගමනය කැරෙන බවද ස්ථිර කරති.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය විසින් නිකුත් කෙරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්.

- නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන අනුරූපව යොදා ගැනීම

- මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය සහ පැහැදිලි මතයක් පිළිබිඹු වීම පිණිස විචක්ෂණ සහ සාධාරණ පදනමක් මත මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වන ඇස්තමේන්තු සහ විනිශ්චයන්.

වත්කම් ආරක්ෂා කර ගැනීමේලා සමාගම විසින් නියමිත සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය කිරීම් සහ ගිණුම් වාර්තා යොදා ගෙන ඇත. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කෙරුණු යෝජනාවකට අනුකූලව සමාගමේ බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගම යලි පත් කෙරිණි. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ ඔවුන්ගේ මතය දැක්වීම පිණිස උචිත බවට ඔවුන් විසින් සැලකිල්ලට ගන්නා ලද අවශ්‍ය පිරික්සා බැලීම් කර ගෙන යෑම සඳහා, නිදහස් ප්‍රවේශයන් ඔවුන් වෙත සැපයිණි. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව ඔවුන්ගේ වගකීම්, පසුව එන පිටුවේ දැක්වෙන විගණක වාර්තාවේ විදහා පෙන්වයි.



ඩි.ජේ.යූ. පුරසිංහ
සභාපති
2014 මැයි 27

එච්.පී.ඊ. ආර්. එස්. හේමචන්ද්‍ර F C A
හේමචන්ද්‍ර සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු

11, විජයබාහු මාවත,
නාවල පාර, නුගේගොඩ, ශ්‍රී ලංකාව
දු. අංකය: + 94112827308 /2829797
ෆැක්ස් : + 94112812803
වි. තැ : hemaco @ sltnet.lk

කොටස් හිමියන් වෙත ඉදිරිපත් කෙරුණු විගණක වාර්තාව
පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

මේ සමඟ ඇති පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් හි 2013 දෙසැම්බර් 31 වැනි දිනට වූ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ද වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කිරීම සඳහා කළමණාකාරිත්වය වගකීමෙන් බැඳේ. මෙම වගකීමට, වංචා හේතුවෙන් හෝ වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක අවප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණව ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම හා ව්‍යවහාර කිරීම සහ අවස්ථානුකූලව සාධාරණ වන්නාවූ ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීමත් ඇතුළත් වේ.

විගණන විෂයපථය හා මතයේ පදනම

අපගේ වගකීම වන්නේ අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය අප විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස අප විසින් විගණනය සැලසුම් කර ඉටු කිරීමට එම ප්‍රමිතිවලින් අවශ්‍ය කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල අගයන් හා හෙළිදරව් කිරීම් සනාථ කිරීම සඳහා උපකාරී වන සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගණනයට ඇතුළත් වේ. භාවිතා කළ ගිණුම්කරණ මූලධර්ම සහ කළමණාකාරිත්වය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එසේ හෙයින් අපගේ විගණනයෙන් අපගේ මතය සඳහා සාධාරණ පදනමක් සපයන්නේ යැයි අපි විශ්වාස කරමු.

විගණන මතය

අපගේ පරීක්ෂණයන්ගෙන් පෙනී යන අන්දමට 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 වැනි දිනට සමාගමේ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය හා මුදල් ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වැනි වගන්තියේ නියමයන්ට ද අනුකූල වේ.

HEMACHANDRA & Co.
Chartered Accountants
NUGEGODA.

හේමචන්ද්‍ර සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු
2014 මැයි 30

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
විස්තීරණ ආදායම් ප්‍රකාශය
2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2013 රු.	2012 රු.
ආදායම	1	206,268,365	217,294,221
විකුණුම් පිරිවැය	2	(107,704,481)	(125,823,189)
දළ ලාභය		98,563,884	91,471,032
අනෙකුත් මෙහෙයුම් ආදායම්	3	20,221,718	15,633,150
		118,785,602	107,104,182
වියදම්			
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්		(3,307,058)	(2,554,403)
ක්ෂයවීම්			
පරිපාලන සහ ආයතන වියදම්		(15,545,190)	(14,059,720)
		(62,660,955)	(58,378,418)
		(81,513,203)	(74,992,541)
මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ලාභය/(පාඩුව)		37,272,399	32,111,641
මූල්‍ය වියදම්	4	(110,369)	(95,792)
බදු පූර්ව ලාභය /(පාඩුව)		37,162,030	32,015,849
බදු අය කිරීම	5	(6,099,832)	5,309,622
බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය/(පාඩුව)		31,062,198	37,325,471
වෙනත් විස්තීර්ණ ආදායම්			
දේපල යන්ත්‍රාගාර උපකරණ ප්‍රත්‍යාගණන ලාභය / (පාඩුව)		-	-
මූල්‍ය වත්කම් විකිණීමෙන් අත්විය හැකි ලාභය/(පාඩුව)		-	-
විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම		-	-
විස්තීර්ණ ආදායම් මත ඇති වන බදු වගකීම		-	-
වෙනත් විස්තීර්ණ ආදායම් මත ඇති වන ශුද්ධ බදු ගෙවීම		-	-
වර්ෂය සඳහා මුලු විස්තීර්ණ ආදායම		31,062,198	37,325,471
කොටසකට ඉපැයීම (රු.)	6	7.76	9.33
කොටසකට ලාභාංශය (රු.)	7	1.12	1.25

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

වත්කම්	සටහන්	2013 රු.	2012 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ	8	301,236,277	273,854,360
කෙරි ගෙන යන වැඩ		987,330	744,330
		302,223,607	274,598,690
ජංගම වත්කම්			
වෙළඳ තොගය	9	13,131,995	16,998,263
වෙළඳ හා වෙනත් ලැබීම්		29,379,494	21,023,183
කාර්ය මණ්ඩල සහ වෙනත් ණය ගැතියන්		17,149,200	14,192,636
තැන්පතු, පූර්ව ගෙවීම් හා අත්තිකාරම්		5,791,086	6,527,791
කෙටි කාලීන ආයෝජන	10	124,847,967	133,378,267
මුදල් සහ මුදල් හා සමාන දේ		5,036,437	1,135,033
මුළු ජංගම වත්කම්		195,336,180	193,255,173
මුළු වත්කම්		497,559,787	467,853,863
ස්කන්ධ මූල ධනය සහ බැරකම්			
මූල ධනය සහ සංචිත			
ප්‍රකාශිත මූල ධනය	11	108,500,000	108,500,000
රඳවා ගත් ලාභය		94,025,871	67,963,672
වෙනත් ස්කන්ධ මූල ධන අයිතමයන්	12	220,795,490	220,795,490
		423,321,361	397,259,162
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	13	6,957,033	6,286,406
විලම්බිත බදු	14	29,780,856	32,029,950
		36,737,889	38,316,356
ජංගම බැරකම්			
වෙළඳ ණය හිමියන් සහ අනෙකුත් ගෙවීම්		36,839,001	32,278,345
මුළු ජංගම බැරකම්		661,536	-
මුළු ස්කන්ධ මූල ධනය සහ බැරකම්		37,500,537	32,278,345
		497,559,787	467,853,863

මෙම මූල්‍ය වාර්තා 2007 වර්ෂයේ සමාගම් පනතේ අංක 7 වගන්තිවලට අනුකූලව සැකසී ඇති බවට සහතික කරමි.

මූල්‍ය අංශ ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ.

මෙම මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

සභාපති **අධ්‍යක්ෂ**

අංක 30 සිට 46 දක්වා පිටුවල දැක්වෙන විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාව හා බැඳුණු කොටස් වේ.

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
ස්කන්ධ මූල ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
2013 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත මූල ධනය රු.	ප්‍රාග්ධන සංචිතය රු.	වෙනත් ස්කන්ධ මූලධන අයිතමයන් රු.	සමුච්චිත ලාභය/ (පාඩුව) රු.	එකතුව රු.
2012 ජනවාරි 01 දිනට ශේෂය	40,000,000	68,500,000	220,795,490	33,638,201	362,933,691
ලාභාංශ ගෙවීම්	-	-	-	(3,000,000)	(3,000,000)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව)	-	-	-	37,325,471	37,325,471
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	40,000,000	68,500,000	220,795,490	67,963,672	397,259,162
ලාභාංශ ගෙවීම්	-	-	-	(5,000,000)	(5,000,000)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව)	-	-	-	31,062,199	31,062,199
2013 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රතිෂ්ඨාපනය කල ශේෂය	40,000,000	68,500,000	220,795,490	94,025,871	423,321,361

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

		2013 රු.	2012 රු.
බදු පූර්ව ශුද්ධ ලාභය /(පාඩුව)	සටහන ඒ	19,378,911	18,080,354
ගැලපුම්			
ක්ෂය ප්‍රතිපාදනය		15,545,190	14,059,720
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය/(පාඩුව)		(123,006)	(40,750)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය		1,248,472	838,395
සේවක ණය පොලී වියදම		659,427	731,345
කාරක මූල ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය		36,708,995	33,669,064
වෙළඳ තොගයේ (වැඩි වීම)/අඩු වීම		3,866,268	7,752,368
වෙළඳ සහ වෙනත් ලැබීම්වල (වැඩි වීම)/අඩු වීම		(8,356,311)	(2,481,525)
කාර්ය මණ්ඩල සහ අනෙකුත් ණය ගැතියන්ගේ (වැඩි වීම)/අඩු වීම		(2,956,563)	(1,979,553)
තැන්පතු පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්වල (වැඩි වීම)/අඩු වීම		736,705	(2,776,982)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වල වැඩි වීම/(අඩු වීම)		(6,944,722)	4,014,140
		(13,654,624)	4,528,448
මෙහෙයුම් කටයුතුවලින් ජනනය කැරුණු මුදල්		23,054,371	38,197,512
ගෙවන ලද ආදායම් බදු		(1,843,546)	(7,351,290)
ගෙවන ලද පාරිතෝෂික		(577,845)	(892,382)
මෙහෙයුම් කටයුතුවලින් ජනනය කැරුණු ශුද්ධ මුදල		20,632,980	29,953,840
ආයෝජන කටයුතුවලින් ලද: භාවිත කැරුණු මුදල් ප්‍රවාහය			
පොළී ආදායම්		17,123,692	13,204,150
දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ මිලට ගැනීම		(42,928,359)	(12,551,084)
දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ විකිණීමෙන් ලත් මුදල		124,256	44,561
කෙරීගෙන යන වැඩ		(243,000)	-
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ		(25,923,411)	697,627
මූල්‍ය කටයුතුවල : භාවිතා කැරුණු - මුදල් ප්‍රවාහය			
ගෙවන ලද ලාභාංශ		-	(3,000,000)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ		-	(3,000,000)
මුදල් සහ මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩි / අඩු වීම		(5,290,431)	27,651,467
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේ	(ආ සටහන)	134,513,300	106,861,833
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දේ	(ආ සටහන)	129,222,869	134,513,300

සටහන ඒ		2013 රු.	2012 රු.
පොලිය සහ බදු පූර්ව ශුද්ධ ලාභය			
බදු පූර්ව සහ පොලිය ගෙවීමට පසු ශුද්ධ ලාභය		37,162,030	32,015,849
ගැලපුම් :- පොලි ආදායම		(17,783,119)	(13,935,495)
පොලිය සහ බදු පූර්ව ශුද්ධ ලාභය		19,378,911	18,080,354

ආ සටහන		2013 රු.	2012 රු.
වර්ෂය අවසානයේ මුදල් සහ, මුදල් හා සමාන දෑ ශේෂය			
ස්ථාවර තැන්පතු	- ලංකා බැංකුව	28,240,556	25,000,000
ස්ථාවර තැන්පතු	- ලංකා බැංකුව	25,000,000	-
ස්ථාවර තැන්පතු	- ලංකා බැංකුව	10,896,244	-
ස්ථාවර තැන්පතු	- හැටන් නැෂනල් බැංකුව	-	3,171,657
	- හැටන් නැෂනල් බැංකුව	4,442,088	3,975,997
නැවත මිලදී ගැනීමේ ගිවිසුම	- මහජන බැංකුව	-	20,256,289
	- මහජන බැංකුව	-	4,026,315
	- මහජන බැංකුව	-	2,074,927
	- මහජන බැංකුව - ඊක්ෂණ	7,000,000	32,600,000
ස්ථාවර තැන්පත්	- මහජන බැංකුව	6,868,103	6,094,433
	- මහජන බැංකුව	8,217,886	7,275,074
	- මහජන බැංකුව	30,118,995	26,665,810
තැන්පතු සහ නැවත මිලදී ගැනීම් ගිවිසුම්		4,064,095	2,237,765
		124,847,967	133,378,267
මහජන බැංකුව		(661,536)	10,017
හැටන් නැෂනල් බැංකුව		1,769,547	1,073,683
සම්පත් බැංකුව		97,477	944
ලංකා බැංකුව		3,141,589	-
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		26,675	46,233
සුළු මුදල් - කළුතර		690	2,656
තැපැල් ගාස්තු අග්‍රිමය		460	1,500
		4,374,902	1,135,033
		129,222,869	134,513,300

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
ගිණුම් සඳහා සටහන්
2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

සංසන්දනාත්මක අනුපාතිකයන්	2013	2012	2011	2010	2009
දළ ලාභ අනුපාතිකය	47.78%	42.10%	47.21%	41.09%	41.49%
තොග පිරිවැටුම් අනුපාතිකය	7.14 වරක්	6.02 වරක්	4.07 වරක්	4.14 වරක්	4.28 වරක්
ණයගැතියන්ට පිරිවැටුම්	12.21%	9.1%	8.61%	8.44%	8.83%
ජංගම අනුපාතිකය	5.20:1	5.98:1	5.81:1	4.73:1	6.71:1
ක්ෂණික වත්කම් අනුපාතිකය	4.85:1	5.46:1	4.94:1	3.93:1	4.63:1
කොටසකට ඉපැයීම (රු.)	Rs.7.76	Rs.9.33	Rs.8.24	Rs.2.39	Rs.3.62
පිරිවැටුමට මුළු වියදම	39.57%	34.55%	33.01%	32.86%	28.97%
කොටසකට ලාභාංශය (රු.)	Rs.1.12	Rs.1.25	Rs.0.75	Rs.0.75	Rs.0.75

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2013 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

1. **සංස්ථාපිත තොරතුරු**

1.1 **වාර්තා කෙරෙන විෂය**

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර එය ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර පිහිටුවා ඇත. එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 13, ශ්‍රී රාමනාදන් පාරේ, අංක 100/25 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.2 **අධ්‍යක්ෂවරු විසින් මූල්‍ය ප්‍රකාශනයන් අනුමත කිරීම**

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2014 අප්‍රේල් 24 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

1.3 **සේවක සංඛ්‍යාව**

වර්ෂය අවසානයේදී, සමාගමේ සේවක සංඛ්‍යාව 70 ක් විය. (2012 වර්ෂයේදී සේවකයන් 64)

1.4 **ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි අවශ්‍යතාව**

රසායන ද්‍රව්‍යයන් ආනයනය කර විකිණීම, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම විය. සමාලෝචිත මුදල් වර්ෂය තුලදී, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්වීම් සිදු වී නොමැත.

1.5 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව ආයතනයේ ගනුදෙනුවලට අදාළව සත්‍ය හා සාධාරණ තත්වයන් නිරූපණය වන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

1.6 **අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඇතුලත් වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ මූලධනයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව සකස් කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තෙක් එම මූල්‍ය වර්ෂය ද ඇතුලත්ව සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව 2012 ජනවාරි 01 වන දින පටන් බලපැවැත්වෙන පරිදි ඉදිරිපත් කර ඇත. මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ පිළිබඳ මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සමගාමීව සකස් වී ඇත.

2. මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමට යොදාගත් පදනම

2.1 වටිනාකම් මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කර ඇති අතර නැවත ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සඳහා හැර අනෙකුත් වත්කම් අයිතම සඳහා අත්පත් කර ගැනීම් පිරිවැය පදනම් කරගෙන සිදු කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා භාවිතා කරන ලද විනිමය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන සහ ආයතනයේ ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ භාවිතා වන විනිමය වන ශ්‍රී ලංකා රුපියල භාවිතා කර ඇත.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හී සිදු වූ වෙනස්කම්

2011 ජනවාරි 01 වන දින ආරම්භක මූල්‍ය තත්ව ප්‍රකාශනය පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරීව අනුගමනය කර ඇත.

සංසන්දනාත්මක අගයන්

පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ඉදිරිපත් කිරීම් සඳහා ශ්‍රේණිගත කිරීම් අදාළ පරිදි සංශෝධනය කර වඩා යහපත් වාර්තාකරණයන් සඳහා මෙම වසර තුලදී නැවත ඉදිරිපත් කර ඇත.

3.2 **විශේෂිත ගිණුම් ඇස්තමේන්තු, තීරණ සහ උපකල්පනයන්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, ගිණුම් ඇස්තමේන්තු, ගිණුම්කරණ උපකල්පනයන් සිදු කිරීමට කළමණාකරණයට සිදු වේ. ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ දී අනාගත කාලපරිච්ඡේද පිළියෙල කරනු ලබන ඇස්තමේන්තු, තීරණ හා ඒවායේ පදනම් හා මූලාශ්‍ර සහ වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වලට ඉන් වන බලපෑම විමර්ශනයට ලක් කර ඇත.

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම යටතේ සාධාරණ අගය ගිණුම්වල වාර්තා කරනු ලබන අතර ප්‍රත්‍යාගණන අතිරික්ත හිමිකම පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සඳහා ස්වාධීන සහ විශේෂඥ තක්සේරුකරුවකු යොදවා වත්කම්වල සාධාරණ අගයන් 2010 දෙසැම්බර් 31 දිනට නිර්ණය කර ඇත.

බදුකරණය

සමාගම ආදායම් බද්දට, එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුව සකස් කිරීමේ දී වර්තමාන ආදායම් බද්ද, විලම්භිත බදු වෙන් කිරීම හා වෙනත් බදු වෙන් කිරීම සඳහා ගිණුම්කරණමය ගණනය කිරීම්, ඇස්තමේන්තු හා ගිණුම්කරණමය තීරණ ගිණුම් සඳහා ගලපා ඇත. ගිණුම් පිළියෙල කරනු ලබන අවස්ථාවන් හීදී නව ගිණුම්කරණ ප්‍රමිත සහ බදුකරණමය නිර්වචනයන් අතර අවිනිශ්චිතව පැවතිණ.

ස්පෘශ්‍ය වත්කම්වල අගය අවප්‍රමාණය වීම

වත්කම් භාවිතයෙන් ජනනය කර ගත හැකි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වඩා හොඳ ඇස්තමේන්තුව ඊට අදාළ අවදානම් හා ගලපා ස්පෘශ්‍ය වත්කම් තක්සේරු කර ඇත. මෙවැනි ඇස්තමේන්තු නිරන්තර වෙනස්කම්වලට භාජනය විය හැකි අතර එසේ අගය අඩු වීමෙන් අලාභයක් හඳුනා ගනී නම් අදාළ වර්ෂය තුළදී ලාභයට එරෙහිව කපා හරිනු ලැබේ.

4. **ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හී සාරාංශය**

4.1 **විදේශ වෙළෙඳ ගනුදෙනු**

විදේශ වෙළෙඳ ගනුදෙනු වටිනාකම් ගනුදෙනුවේ දිනට පවතින විනිමය අනුපාතයන් අනුව ගිණුම්ගත කරනු ලැබේ. විදේශ විනිමයන්ගෙන් කරන ලද මූල්‍ය වත්කම් ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. පෙර කාලපරිච්ඡේදයේදී මිලදී ගනු ලැබූ මූල්‍ය නොවන අයිතමයන් පරිවර්තනය කරනු ලබන දිනට පවතින අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. විදේශ වෙළඳ ගනුදෙනු වාර්තාකරණයේදී ඇති වන විනිමය හුවමාරු ලාභ අලාභ ආදායමට ගලපනු ලැබේ.

4.2 බදු

වර්තමාන බද්ද

ආදායම් බදු වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපණය කරනු ලබන ලාභයට 2006 අංක 06 දරණ දේශිය ආදායම් පනතේ දක්වා ඇති ගැලපීම් කිරීමෙන් පසු ගණනය කරනු ලැබේ.

විලම්භිත බදු

විලම්භිත බදුකරණය වගකීම් ක්‍රමය භාවිතා කර සිදු කරනු ලබන අතර වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වල තාවකාලික වෙනස් වීම් වෙන් කිරීම සඳහා සිදු කරනු ලැබේ. වත්කම්වල ලියාහල ගිණුම්කරණ අගයට හා බදුකරණ ලියා හල අගය අතර වෙනසට සිදු කරන ලද ගණනය කිරීම, විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා කරනු ලබන ගණනය කිරීමට ගලපා ඇත.

සියලුම පවත්වාගෙන යන අගයන් හී තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වෙන් කිරීම සිදු කරනු ලබන අතර හිලව් කිරීමට නොහැකි වූ බදුකරණ අලාභ ඉදිරියේදී බදුකරණ ලාභයෙන් ආවරණය කිරීම සඳහා ඉදිරියට ගෙන යනු ලබයි.

විලම්භිත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනකදීම පසුවිපරමට ලක්කොට ඒවායින් ආවරණය කර ගත යුතු ප්‍රමාණ කොටස් හෝ සම්පූර්ණ වශයෙන් බදුකරණ ලාභයන්ගෙන් ආවරණය කරනු ලැබේ.

4.3 දේපල පිරියත හා උපකරණ

නිර්ණය කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව සහ එම වත්කම භාවිතයෙන් ආයතනයට ඇති වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ගණනය කිරීමෙන් වත්කම්වල වටිනාකම් නිර්ණය කර ඇත.

ගණනය කිරීමේ පදනම

දේපල පිරියත උපකරණයන්ගේ පිරිවැය හෝ තක්සේරුගත වටිනාකමෙන් එකතු වූ ක්ෂය වීම් සහ අගය අඩු වීම් අඩු කොට වටිනාකම් දක්වා ඇත. දේපල පිරියත උපකරණයන්ගේ අගය අඩු වීම සඳහා අදාළ හේතු සාධක ඇති වන අවස්තාවන්වලදී නිරන්තර විමර්ශනයට භාජනය කර අදාළ ගැලපීම සිදු කරනු ලබයි. දේපල පිරියත උපකරණ නැවත තක්සේරු කරන අවස්තාවලදී අදාළ භාණ්ඩයේ සියලුම වත්කම් අයිතම අගය තක්සේරුකරණයට ලක් කරනු ලබයි.

ප්‍රත්‍යාගණනය කරන ලද දිනට පැවති සමුච්චිත ක්ෂය අගයන් එකිනෙකට හිලව් කොට ලැබෙන ශුද්ධ අගය ප්‍රත්‍යාගණිත අගයන් අතර වෙනස ප්‍රත්‍යාගණිත අතිරික්තය ලෙස ගිණුම්වල වාර්තා කරයි. ප්‍රත්‍යාගණිත වත්කම් විකිණීමේ දී ඊට සම්බන්ධ සංචිතයන් රඳවා ගත් ලාභයන්ට මාරු කර ඇත

නීතිප්‍රකාර පිළිගැනීම

දේපල භාණ්ඩ, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න නීති ප්‍රකාර ආදේශනය කිරීමෙන් පසු පිළිගැනීමට හෝ බැහැර කිරීමට හෝ මතු පිරිමැසුම් සඳහා ලැබෙන්නා වූ ප්‍රතිලාභ බලාපොරොත්තු විය හැක. නීති ප්‍රකාර පිළිගැනීම් නිසා සිදුවන ලාභ සහ පාඩු එම වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුලින් ඉදිරිපත් කර ඇත.

වටිනාකම අඩුවීම

මූලික ක්‍රමය අනුව පිරිවැය හෝ මුලු දේපලවල ධාරිතාව, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සහ නිදහස් ඉඩම් අතහැර, මෙම ගණන් හිලව් කපා හැරීම පිළිබඳව තක්සේරු කිරීම ආර්ථික වත්කම් අනුව සිදුවේ.

නැවත අගය කරන ලද වත්කම්වල වටිනාකම අඩු කිරීම කළ යුත්තේ ඉතිරි ජීවිත කාලය තුල අවශ්‍ය ආර්ථික වත්කම් එකිනෙක භාණ්ඩ උපයෝගී කර ගනිමිනි.

වටිනාකම අඩුවීම සිදුවන්නේ නව පිරිවැය එකතුවීම මත ඇතිවන පහත සඳහන් ක්‍රමය අනුවය.

දේපළ	වාර්ෂික ගණන %
ගොඩනැගිලි	05.00
මෝටර් රථ	25.00
සිලින්ඩර් සහ / බහාලුම්	12.50
මෙවලම් /උපකරණ	12.50
කාර්යාල උපකරණ	12.50
ගෘහභාණ්ඩ + උපකරණ	12.50
යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර	12.50
පරිගණක . උපාංග	33.33
පණිවිඩ හුවමාරු සහ සන්නිවේදන ආම්පන්න	33.33
පාපැදි	12.50

4.4 **මූල්‍ය සාධනපත්‍රය - මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

මූල්‍ය වත්කම්

මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම

LKAS 39 අනුව විෂයන් වශයෙන් වර්ග කර ඇත්තේ මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු අනුව, ණය පහසුකම් හා නැවත ලැබීම, ආයෝජනය කරන ලද මුදල් පරිණත වීම, මූල්‍ය වත්කම් විකිණීම සඳහා යෙදීම වශයෙනි. මූලික හඳුන්වාදීමේදී සමාගම තමන්ගේ මූල්‍ය වත්කම් අනුව වර්ගීකරණය ගැන නිශ්චය කරනු ලබයි.

සමාගමේ මූල්‍ය වත්කම්හි මුදල්, කෙටිකාලීන තැන්පතු, වාණිජ සහ අනිකුත් ලැබීම්, ණය පහසුකම් සහ අනිකුත් ලැබීම් ඇතුලත්ව ඇත.

පසු ඇගයීම

මූල්‍ය වත්කම් ඇගයීමේ දී ඔවුන්ගේ වත්කම් වර්ගීකරණය පහත සඳහන් ලෙස දැක්වේ:

ණය සහ ආපසු ලැබීම්

ණය සහ ආපසු ලැබීම් යනු යම් කිසිවකින් නොලැබුණු මූල්‍ය වත්කම් ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් ලෙස ක්‍රියාකාරී වෙළඳපොලෙ හි දක්වා නොමැත. මූලික ඇගයීමෙන් පසු මෙවැනි මූල්‍ය වත්කම් එම මිලෙන් හිලව් කිරීමත්, සහ EIR ක්‍රමය බලපවත්වමින් පොලිය අඩුකිරීමත් සිදුවේ. හිලව් කිරීමේ මිල ගණන් බැලීමේ දී කිසියම් අඩුකිරීමක් හෝ වාරිකයක් ලබා ගැනීමේ දී හෝ සහ ගාස්තු හෝ මිලගණන් අඛණ්ඩව EIR හි කොටසක් වීමය. මෙම EIR හිලව් කිරීම මූල්‍ය ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුලු කර ඇත. අපවය කිරීමේ දී ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයේ පිළිගත් දෙයක් හැටියට අඩංගු වී ඇත.

මූල්‍ය වගකීම්

මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම

LKAS 39 හි අඩංගු මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත්තේ ලාභය හෝ අලාභය, ණය දීම් සහ ණය ලබා ගැනීමත් ලෙසය. මූලික හඳුනාගැනීමේ දී මෙම වර්ගීකරණයන් මූල්‍ය වගකීම් ලෙස සමාගම හඳුනාගනියි.

මූලිකවම හඳුනාගත් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්, ණය දීම සහ ණය ගැනීම ක්‍රමානුකූලව ණය හිලවු කරනු ඇත. මෙයට අප්‍රමාදව ආරෝපණය කළ යුතු ගනුදෙනු අගයන් ඇතුලත් කර ඇත.

ගණන් හිලව් සහ අනිකුත් ගෙවීම් සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ.

4.5 **පරිලේඛන**

පරිලේඛන මිල කර ඇත්තේ, වටිනාකමට අඩු ලෙස සහ දළ මුදල් වීමේ අගයන් අනුවය. දළ මුදල් වීමේ වටිනාකම විකුණුම් තක්සේරු මුදලින් සමාප්තිය සඳහා යොදන පිරිවැය සහ විකිණීම සඳහා තක්සේරු කිරීමය.

4.6 **වාණිජ සහ අනෙකුත් ලැබීම්**

ණයකරුවන් සහ අනෙකුත් ලැබිය යුතු දේ වල මිල තක්සේරු කර දළ අධිගත ප්‍රතිපාදන අඩමාන ලැබීම ලෙස නම් කර ඇත.

අවලංගු හා අඩමාන ණය පහත සඳහන් කොන්දේසි අනුව පෙන්වා ඇත.

වර්ෂ 1 - 2	25%
වර්ෂ 2 - 3	50%
වර්ෂ 3 කට වැඩි	100%

4.7 මූල්‍ය සහ මූල්‍ය සමඵල

මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාපිතයේ අඩංගු වී ඇති බැංකුවේ ඇති මූල්‍ය ධනය, සහ අතේ රැඳී ඇති මූල්‍ය ධනය ප්‍රකාශනයේ ඇති වියදම් සඳහාත්, මූල්‍ය සහ මූල්‍ය ස්ථාපිතයේ ඇත්තේ මූල්‍ය සහ කෙටිකාලීන තැන්පතු අඩංගු වී ඇත.

4.8 පාරිතෝෂිකය සඳහා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම අනුව සේවකයෙකුට විශ්‍රාම යන විට ලැබිය යුතු ප්‍රතිලාභ, සාමාන්‍යයෙන් ඔහු විශ්‍රාම යනවිට සේවය කල සේවා කාලය අනුව තීරණය වේ. සමාගම සේවකයෙකුට පාරිතෝෂික මුදලක් ගෙවීම ව්‍යවස්ථානුකුලව වන අතර, මෙම පාරිතෝෂික දීමනාව නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අනුව බව පිළිගත යුතුය. සමාගම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ කරුණු ඇතුලත් කර ඇත. මෙම පාරිතෝෂිකය ලබා දීමේ දී මෙම ප්‍රතිලාභ සැලසුම අනුව ගණනය කිරීමේදී එම සැලසුම් අනුව පාරිතෝෂිකය ගණනය කරන්නේ ප්‍රක්ෂිප්ත වැය ඒකක අනුවය. මෙම කාල සීමාව තුල සිදුවන්නා වූ ලාභ හෝ අලාභ මෙම පාරිතෝෂික මුදල් ගෙවීමේ දී බලපානු ඇත.

නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල

මූල්‍ය ප්‍රකාශනයේ විස්තර සහිතව දායකත්වය ලබා දීම ඉහත සඳහන් ප්‍රකාශනයේ වැය කිරීමක් ලෙස උපයනු ලබන මූල්‍යයන්හි යටත් වේ.

4.9 වගකීම් සහ ගිවිසුමක ඇතුලත් නියෝග

ගලාඑන සම්පත් සහ ආර්ථික ප්‍රතිලාභ බැඳීම් හේතුකොට ගෙන පැරණි සිදුවීම් මත දැනට ඇති වී ඇති අවනතභාවය මත නිකුත් කර ඇති මූල්‍ය ස්ථාපිතයේ වගකීම් සහ ගිවිසුම් නියෝග ඇතුලත් කර ඇත.

ණය හිමියන් විසින් කරනු ලබන ඉල්ලුම් හෝ ශේෂය දක්වා ඇති දේවල් වර්තමාන වගකීම් ලෙසත් ලේඛන ශේෂ ලේඛන වලට වසරකට පසුව ඉදිරිපත් කරන විට ඒවා වර්තමානයට පෙර වගකීම් ලෙස ශේෂ පත්‍රය අනුව වර්ග කරනු ලැබේ.

4.10 වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයෙන් පසු සිදුවන සිදුවීම

මූල්‍ය පත්‍රිකා නිකුත් කිරීම සඳහා බලය පැවරීමේ දිනයෙන් අනතුරුව සිදුවන මනාප හෝ අවාසි සිදුවීම් වාර්තා කිරීමේ කාලයට පසුව හෝ වාර්තා කිරීමේ කාලය අවසානයේ දී සිදුවිය යුතුය.

මෙම වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම් ගැන සිතාමතා නිසි ලෙස සැකසුම් කර හෝ හෙලිදරව් කිරීමෙන් අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය පත්‍රිකා වල වෙනස් කිරීම් සිදුකළ හැක.

4.11 සිලින්ඩර් සඳහා ලබා ගත් තැන්පත් නැවත ගෙවීම

සමාගම විසින් නිකුත් කරන ලද සිලින්ඩර් සඳහා පාරිභෝගිකයින්ගෙන් නැවත ගෙවීමේ පදනම මත ලබා ගත් තැන්පතු සිලින්ඩර් බාර දීමෙන් පසු නැවත ගෙවනු ලැබේ. බෙදා හැරීම් නියෝජිත

සමග ඇති ගිවිසුම අවලංගු කරන අවස්ථාවේදී, නැවත ලබාදෙන සිලින්ඩර් සඳහා නැවත ගෙවීම් කරන අතර, සමාගමට ලබා නොදෙන සිලින්ඩර් සඳහා ලබාගත් මුදල් සමාගමට සින්න වෙයි.

4.12 ආදායම පිළිගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිසා ආදායම ගැන පිළිගැනීමක් ඇති අතර, මේ අනුව ආදායම සහ හවුල් වියදම් ඇතිවීම හෝ ඇතිවීමට සිදුවීම නිසි පරිදි ස්ථිර කළ හැක. ආදායම නිසි පරිදි ගණනය කිරීමට හැක්කේ ලැබෙන්නා වූ ප්‍රතිෂ්ඨාව හෝ ලැබෙන්නා වූ දළ වාණිජ මට්ටම් සහ අගය එක්කල බදු, සමාගම තුල සිදුවන්නා වූ විකුණුම් බැහැර කිරීමෙන් පසුවය. පහත සඳහන් විශේෂ මිනුම් දණ්ඩක් ආදායම පිළිගැනීම සඳහා යොදනු ලැබේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමේ දී මෙම සමූහයේ කළමණාකාරිත්වය මෙම භාණ්ඩ ගැනුම්කරුට අයිතිය පැවරීමෙන් පසු එම භාණ්ඩ සඳහා හවුල් කර ගැනීමක් නොමැති බවත් මෙම භාණ්ඩ ගැන කිසිදු පාලනයක් නොමැති බවත් සනාථ වූ පසු මෙම ආදායම පිලිගනු ලැබේ.

වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු

වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු සඳහා අගය එකතු කල බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, යනාදී බදු නියම පරිදි ක්‍රමානුකූලව ගෙවනු ලැබේ.

පොලී ආදායම

සම්භාවී ක්‍රමය අනුස්ථිර පිරිවැය සහ මූල්‍ය පිරිවැයට ලැබෙන පොලිය වර්ග කිරීම තුල විකිණීම, පොලී ආදායම හෝ වියදම වාර්තාගත කිරීම අනුව ප්‍රබල පොලී අනුපාතය (EIR) මෙය අනුව මෙමගින් අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම්, මූල්‍ය පිරිවැය කාලයට අනුව හෝ කෙටි කාලයකට, සරිලන ලෙස දළ ආදායම හෝ වගකීමයි. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත.

ලාභ සහ අලාභ

සම්පීඩන ආදායම් ප්‍රකාශනයේ ලාභ සහ අලාභ ලෙස ස්වභාවයෙන් නැගී එන්නේ දේපල, යන්ත්‍ර සහ ආම්පන්න සහ අනිකුත් අවලංගු වත්කම් සහ අනිකුත් තැන්පතු සමාගමේ විශේෂිත මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇත්තේ විකිණීමෙන් ලැබූ ආදායම අඩු කර එවන් වත්කම් වියදම් වලට යා කිරීමෙනි.

අනිකුත් ආදායම්

අනිකුත් ආදායම් සමාගණනය සාධක කොට හඳුනා ගැනීමට හැකිය.

4.13 වියදම් හඳුනාගැනීම

යම්කිසි භාණ්ඩයකින් ලැබෙන්නා වූ ආදායම සහ ඍජු පිරිවැය සමග ඇති ඍජු සහභාගිත්වය නිසා, විස්තර සහිත මූල්‍ය ප්‍රකාශනයේ වියදම හඳුනා ගැනීමට හැකිය.

මෙම විස්තර සහිත ප්‍රකාශනයට සමාගම සඳහා යන වියදම, දේපල නඩත්තු කිරීම, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න කාර්යක්ෂම ලෙස භාවිතය යන වියදම් සියල්ල මෙම ප්‍රකාශනයට ඇතුලත් කොට ඇත.

5. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** (SLFRS/LKAS) **නිකුත් කර ඇති නමුත් තවමත් ක්‍රියාකාරී වී නැත.**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත දක්වා ඇති නමුත් ප්‍රමිතීන් නිකුත් කර ඇතත්, ඒවා ක්‍රියාකාරී නොවන බව සහ ප්‍රකාශන නිකුත් කල දින දක්වා නොමැත. මෙම ප්‍රමිතීන් ලැයිස්තු ගත කිරීම සහ අර්ථනිරූපණ නිකුත් කිරීම් කර නොමැති අතර, සමාගම ඉදිරි දිනයකදී මෙය බලපානු ඇතැයි විශ්වාස කරනු ලබයි. සමාගමට මෙම ක්‍රියාවලිය බලපාන විට ඒවා නිසි පරිදි සම්මත කිරීමට පැහැදි සිටියි.

අ) SLFRS-9 මූල්‍ය ප්‍රකාශන: වර්ගීකරණය සහ ඇගයීම LKAS 39 විස්තර කර ඇති මූල්‍ය වගකීම් මූල්‍ය වත්කම් මැනීම සහ වර්ගීකරණය SLFRS 9 යන ඡේදයට පැවරෙන අතර ඒ ආකාරයෙන් සිදුවේ. මෙම මිනුම වාර්ෂිකව 2015 ජනවාරි 01 වන දින ආරම්භ වේ. සමාගමේ මූල්‍ය වත්කම්හි වර්ගීකරණය හා මිනුම් SLFRS 9 අනුව බලපාන අතර, එයින් මූල්‍ය වර්ගීකරණයකට හෝ වගකීමකට බලපානු නොලැබේ.

ආ) SLFRS 13 සාධාරණ මිල ඇගයීම - SLFRS 13 යටතේ තනි උපදේශකත්වයක් යටතේ මූලාශ්‍රයක් මත සාධාරණ මිලක් නියම කරයි.

6. SLFRS/LKAS **මූලික පිළිගැනීම**

SLFRS/LKAS අනුව පිළියෙල කරන ලද මුල්ම මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 31 වනදා අවසන් වන වර්ෂය සඳහාය. 2011 දෙසැම්බර් 31 දින අවසන් වන වර්ෂය සහ ඊට පෙර මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වන අතර එය 2011 දෙසැම්බර් මස 31 වන දා තෙක් බලපායි.

මේ අනුව සමාගම විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS 2011 දෙසැම්බර් 31 සඳහා එලෙස අනුකූලව බලපාන ලෙසත් එම SLFRS/LKAS ප්‍රමිතිවලට යටත් වන ලෙසත්, 2012 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය විග්‍රහ කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුවය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමාගමේ මුල් ප්‍රකාශන පළියෙල කර ඇත්තේ 2011 දෙසැම්බර් 31 වන දිනට වන අතර සමාගම සංක්‍රමණය වී ඇත්තේ 2011 ජනවාරි 01 වන දින පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ දීය. මෙම පත්‍රිකාවෙන් සමාගම විසින් කරන ලද අනුකූලනය නැවත ප්‍රකාශ කිරීම හෝ ප්‍රසිද්ධ කරන ලද 2011 දෙසැම්බර් 31 වන දින SLAS මූල්‍ය ප්‍රකාශන සමග සම්බන්ධ බවයි.

7. **ගිවිසුම් කෙරෙහි අධ්‍යක්ෂවරුන් දක්වන උනන්දුව**

ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ, ඒ. ජේ. ගමගේ මහතා, එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා, එච්. ඒ. එන්. එස්. කුමාර මහතා. එම්. ශෂිකරන් මහතා, ඩී. ජේ. ඒ. විශ්වමිත්‍ර මහතා, බී. පී. ගුණවර්ධන මහතා යන මහතුන් 2013 දෙසැම්බර් 31 දක්වා සමාගමේ අධ්‍යක්ෂවරු වශයෙන් සේවය කළහ. ඩී. එම්. පී. ඒ. දසනායක මහතා, සරත් කුමාර මහතා යන දෙදෙනා පිළිවෙලින් 2013 ජූනි 24 දින සහ 2013 සැප්තැම්බර් 17 වන දා අධ්‍යක්ෂ තනතුරෙන් විශ්‍රාම ලැබූහ. එම දෙදෙනා සමාගම සමග කිසිදු ගිවිසුමක් ඇති කර නොගත් බවට සහතික කර ඇත.

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
ගිණුම් සඳහා සටහන්
2013 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

		2013 රු.	2012 රු.
1	**ආදායම**		
	විකුණුම්	209,109,472	220,180,897
	අඩු කරන්න : පිරිවැටුම් බදු	-	-
	අඩු කරන්න : ජාතිය ගොඩනැගීමේ බද්ද	(2,841,107)	(2,886,676)
		206,268,365	217,294,221
2	**විකුණුම් පිරිවැය**		
	ආරම්භක තොගය	10,420,882	18,659,970
	එකතු කරන්න : මිල දී ගැනීම්	104,854,111	117,584,101
		115,274,993	136,244,071
	අඩු කරන්න : අවසාන තොගය	(7,570,512)	(10,420,882)
		107,704,481	125,823,189
3	**අනෙකුත් මෙහෙයුම් ආදායම**		
	සේවක ණය සඳහා පොලිය	1,192,440	1,088,679
	ස්ථාවර තැන්පතු, ඊක්ෂණ තැන්පතු සඳහා පොලිය	16,590,679	12,846,817
	වෙනත් ආදායම්	2,315,593	1,656,904
	ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	123,006	40,750
		20,221,718	15,633,150
4	**මෙහෙයුම් ලාභය**		
	පහත දැක්වෙන වියදම් සඳහා අය කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය දැක්වේ.		
	ක්ෂය ප්‍රතිපාදන	15,545,190	14,059,720
	විගණක වේතනය	66,300	66,300
	සේවක පිරිවැය (සටහන 4.1)	31,185,051	29,598,321
4.1	**සේවක පිරිවැය**		
	වැටුප්, වේතන සහ අනෙකුත් අදාළ වියදම්	25,789,627	24,967,249
	සේවා අවසන් පාරිතෝෂිකය	1,248,472	838,395
	සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල	4,146,952	3,792,677
		31,185,051	29,598,321
	පහත දැක්වෙන විස්තර ඉහත ඇතුලත් කර ඇත.		
	සභාපතිතුමාගේ සහ විධායක අධ්‍යක්ෂතුමාගේ සංවේතන	1,260,000	1,260,000
	අධ්‍යක්ෂ ගාස්තු	329,400	318,000
		1,589,400	1,578,000

			2013 රු.	2012 රු.
5	**බදුකරණය**			
	වර්තමාන ආදායම් බද්ද			
	සාමාන්‍ය කටයුතු පදනම් කරගෙන වර්තමාන බදු	සටහන 5.1	8,348,926	7,022,168
	පූර්ව වර්ෂයේ අධි ප්‍රතිපාදන සඳහා ගැලපුම්		-	-
	විලම්භිත ආදායම් බදු ගාස්තුව / (ආපසු හැරවීම)	සටහන 5.2	(2,249,094)	(12,331,790)
			6,099,832	(5,309,622)

5.1 **ගිණුම් ලාභය සහ බදු ලාභය සංසන්දනය කිරීම**

ගිණුම් අනුව ශුද්ධ ලාභය	37,162,030	32,015,849
අවසර දිය නොහැකි වියදම්වල එකතුව	21,093,361	17,863,571
	58,255,391	49,879,420
අවසර දිය හැකි වියදම්වල එකතුව	(17,779,369)	(12,079,066)
බදු අය කළ හැකි ලාභය	40,476,022	37,800,354
බදු අය කිරීම	8,348,926	7,022,168

බදු ඇගයුම් වර්ෂය 2011 / 2012 සඳහා වන ආදායම් බදු, වර්ෂය 2010 / 2011 වර්ෂයට නියමිත අපේක්ෂිත ප්‍රතිශතයෙන් ගණනය කෙරිණි. කල්තියා ගෙවන ලද මෙම බද්දේ අගය රු. 9,094,865.00 වේ. එහෙත් බදු ඇගයීම් වර්ෂය 2011 / 2012 සඳහා අපේක්ෂිත ප්‍රතිශතය යටතේ ගණනය කළේ නම් එම බද්දේ නිවැරදි ගණන රු. 5,562,654.02 වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගම විසින් කල්තියා අතිරේකව ගෙවන ලද රු. 4,065,265.00 අප ගිණුමෙහි දැක්වේ. මෙම මුදල නැවත ගෙවනු ලබන ණය පහසුකමක් වශයෙන් ලබා දෙන මෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියෙමු. එහෙත් මේ දක්වා මේ පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොමැත.

5.2 **විලම්බිත බදු වියදම් / (ආදායම)**

කාල වෙනස් වීම හේතුවෙන් කල්තැබීමට සිදු වූ බදු වියදම්	(2,249,094)	(12,331,790)
	(2,249,094)	(12,331,790)

6 **කොටසකට ඉපැයීම්**

6.1 කොටසකට මූලික ඉපැයීම් ගණනය කෙරෙන්නේ එම වර්ෂය තුල නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය තුලින්, සාමාන්‍යය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන අදාළ වර්ෂය සඳහා ශුද්ධ ලාභය බෙදා දීමෙනි. ප්‍රසාද දීමනා ප්‍රශ්නයක් වැනි, සම්පත්වල අනුරූප වෙනසක් නොමැතිව නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් කිරීම්වලට භාජනය කෙරුණු සිදුවීම් සඳහා මෙම වර්ෂය තුල සහ පූර්ව වර්ෂය තුල නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය ගලපනු ලැබේ.

6.2 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටස් ගණනය කිරීමක මූලික ඉපැයීම්වලදී භාවිතා කෙරුණු ආදායම සහ කොටස් දත්ත පහත පෙන්නුම් කෙරේ.

	2013 රු.	2012 රු.
ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය		
ශුද්ධ ලාභය / (පාඩුව)	31,062,199	37,325,471
කොටසකට ඉපැයීම් වෙනුවෙන් සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන ශුද්ධ ලාභය	31,062,199	37,325,471

	2013 රු.	2012 රු.
හරයන් වශයෙන් උපයෝගි කෙරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		
කොටසකට මූලික ඉපැයිම්වලට අදාළ නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍ය	4,000,000	4,000,000
	4,000,000	4,000,000
කොටසකට ඉපැයිම්	7.76	9.33

7 කොටසකට ලාභාංශයන්

ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය

වර්ෂය සඳහා ලාභාංශය	4,500,000	5,000,000
හරයන් වශයෙන් උපයෝගි කෙරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		
කොටසක ලාභාංශවලට අදාළ ව නිකුත් කර ඇති සාමාන්‍ය කොටස්	4,000,000	4,000,000
කොටසක ලාභාංශ	1.12	1.25

8. දේපළ යන්ත්‍රාගාර සහ උපකරණ

පිරිවැය	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ	ගෘහ භාණ්ඩ සහ වැද්දුම්	කාර්යාල උපකරණ	පරිගණක	මෝටර් වාහන	සිලින්ඩර්	පා පැදි	ආවුද සහ උපකරණ	සන්නිවේදන හා මීඩියා උපකරණ	නැවත ප්‍රතිෂ්ඨාපිත වටිනාකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ගැනුම් මිලෙහි												
2013 ජනවාරි 01 ශේෂය	70,000,000.00	24,374,517.50	1,648,184.00	2,365,607.62	2,016,674.07	1,786,900.00	25,988,252.00	173,032,999.93	2,500.00	363,492.00	183,750.00	301,762,877.12
එකතුකරන්න. වර්ෂය තුළ එකතු කිරීම	-	-	483,658.00	105,855.29	323,389.28	492,900.00	5,200,000.00	36,272,756.06	-	-	49,800.00	42,928,358.63
												-
අඩු කරන්න. ඉවත් කිරීම සහ මාරු කිරීම	-	-	-	(1,000.00)	(7,850.00)	(42,550.00)	-	(84,500.00)	(2,500.00)	(3,400.00)	-	(141,800.00)
2013 දෙසැම්බර් 31 ශේෂය	70,000,000.00	24,374,517.50	2,131,842.00	2,470,462.91	2,332,213.35	2,237,250.00	31,188,252.00	209,221,255.99	-	360,092.00	233,550.00	344,549,435.75
ක්ෂය වීම්												
2013 ජනවාරි 01 ශේෂය	-	879,866.60	253,376.65	703,792.70	1,074,826.11	761,191.01	10,977,462.94	12,977,371.12	2,500.00	231,126.22	47,004.16	27,908,517.51
එකතු කරන්න. වර්ෂය සඳහා අය කිරීම්	-	443,886.60	196,897.50	317,856.65	330,416.92	517,752.62	5,721,977.82	7,916,625.88	-	26,658.11	73,118.22	15,545,190.32
අඩු කරන්න. ඉවත් කිරීම සහ මාරු කිරීම	-	-	-	(1,000.00)	(6,600.00)	(42,550.00)	-	(84,500.00)	(2,500.00)	(3,400.00)	-	(140,550.00)
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,323,753.20	450,274.15	1,020,649.35	1,398,643.03	1,236,393.63	16,699,440.76	20,809,497.00	-	254,384.33	120,122.38	43,313,157.83
ශුද්ධ පොත් අගය 2013 දෙසැම්බර් 31 දිනට	70,000,000.00	23,050,764.30	1,681,567.85	1,449,813.56	933,570.32	1,000,856.37	14,488,811.24	188,411,758.99	-	105,707.67	113,427.62	301,236,277.30

පිරිවැය	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ	ගෘහ භාණ්ඩ සහ වැද්දුම්	කාර්යාල උපකරණ	පරිගණක	මෝටර් වාහන	බහාලන	පා පැදි	ආවුද සහ උපකරණ	සන්නිවේදන හා මීඩියා උපකරණ	නැවත ප්‍රතිෂ්ඨාපිත වටිනාකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ගැනුම් මිලෙහි												
2012 ජනවාරි 01 දිනට ශේෂය	70,000,000.00	24,374,517.50	1,155,500.00	2,203,039.59	1,690,500.07	1,235,350.00	15,488,252.00	173,127,704.71	2,500.00	324,260.00	-	289,601,623.87
එකතු කරන්න. වර්ෂය තුළ එකතු කිරීම්	-	-	492,684.00	293,485.13	382,483.00	659,450.00	10,500,000.00	-		39,232.00	183,750.00	12,551,084.13
												-
අඩු කරන්න. ඉවත් කිරීම් සහ මාරු කිරීම	-	-	-	(130,917.10)	(56,309.00)	(107,900.00)	-	(94,704.78)		-	-	(389,830.88)
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	70,000,000.00	24,374,517.50	1,648,184.00	2,365,607.62	2,016,674.07	1,786,900.00	25,988,252.00	173,032,999.93	2,500.00	363,492.00	183,750.00	301,762,877.12
ක්ෂය වීම්												
2012 ජනවාරි 01 දිනට ශේෂය	-	435,980.00	118,459.84	496,893.64	645,481.31	500,427.49	5,187,128.96	6,693,640.34	2,500.00	154,305.61	-	14,234,817.19
එකතු කරන්න. වර්ෂය සඳහා අය කිරීම්	-	443,886.60	134,916.81	334,005.20	485,653.80	368,663.52	5,790,333.98	6,378,435.56	-	76,820.61	47,004.16	14,059,720.24
අඩු කරන්න. ඉවත් කිරීම හා මාරු කිරීම්	-	-	-	(127,106.14)	(56,309.00)	(107,900.00)	-	(94,704.78)		-	-	(386,019.92)
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	879,866.60	253,376.65	703,792.70	1,074,826.11	761,191.01	10,977,462.94	12,977,371.12	2,500.00	231,126.22	47,004.16	27,908,517.51
ශුද්ධ පොත් අගය 2013 දෙසැම්බර් 31 දිනට	70,000,000.00	23,494,650.90	1,394,807.35	1,661,814.92	941,847.96	1,025,708.99	15,010,789.06	160,055,628.81	-	132,365.78	136,745.84	273,854,359.61

8.1 යන්ත්‍ර සහ උපකරණ වත්කම් නැවත තක්සේරු කිරීම

දේපළ යන්ත්‍රාගාර සහ උපකරණයන් හී වර්තමාන වටිනාකම් මැනීම සඳහා සමාගම ප්‍රත්‍යාගණන ක්‍රමවේදය භාවිතා කරයි. දේපල යන්ත්‍රාගාර සහ උපකරණ ප්‍රත්‍යාගණන කාර්යය සමාගම ස්වාධීන සහ විශේෂ වෘත්තිකයෙකු වශයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටු කරවා ගෙන ඇත. මූර්ත වටිනාකම් තීරණය කිරීමේදී වෙළඳපොළ වටිනාකම් පාදක කොට ගෙන ඇති අතර යම් වත්කමක් වෙනස්කම්වලට අදාළව ගැලපීම් සිදු කර ඇත. ආසන්නතම ප්‍රත්‍යාගණනය 2010 දෙසැම්බර් 31 දිනට බලපැවැත්වෙන පරිදි සිදුකර ඇති අතර අදාළ තොරතුරු පහත පරිදි වේ.

දේපළ	තක්සේරු ක්‍රමවේදය	බලපැවැත්වෙන දිනය	දේපල තක්සේරුකරු
පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් හි දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ	විවෘත වෙළඳපොළ ක්‍රමය	2010.12.31 දිනට ශේෂය	තක්සේරු දෙපාර්තමේන්තුව

		2013 රු.	2012 රු.
9	**පවතින භාණ්ඩ තොග**		
	දියර ක්ලෝරින් - කි. ග්‍රෑ. 900	6,501,306	7,891,807
	දියර ක්ලෝරින් - කි. ග්‍රෑ. 68	610,330	100,964
	කෝස්ටික් සෝඩා	456,863	1,509,973
	හයිඩ්‍රොක්ලෝරික් අම්ලය	-	906,661
	බ්ලීචිං දියර	2,013	10,698
	බ්ලීචිං පවුඩර්	-	779
	පවතින අලෙවි තොග	7,570,512	10,420,882
	ක්ලෝරින් වෑල්ව් - ස්පින්ඩ්ල්ස්, වොෂස්, ප්‍රොටෙක්ටර්ස්, ස්පැනර්ස් සහ වෑල්ව්ස් කම්ප්ලීට්	3,775,331	4,667,769
	ප්‍රොටෙක්ටිව් හුඩ්ස්	162,300	162,300
	හදිසි අවස්ථා උපකරණ කට්ටලය	1,396,843	1,341,884
	ලිපි ද්‍රව්‍ය	227,009	405,429
	පවතින තොග මුළු ගණන	13,131,995	16,998,263

10	**කෙටි කාලීන ආයෝජන**		
	ස්ථාවර තැන්පතු - හැටන් නැෂනල් බැංකුව	-	3,171,657
	ස්ථාවර තැන්පතු - හැටන් නැෂනල් බැංකුව	4,442,088	3,975,997
	නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව	-	20,256,289
	නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව	-	4,026,315
	නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව	-	2,074,927
	නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව - ඊක්ෂණ තැන්පතු	7,000,000	32,600,000
	ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	10,896,244	-
	ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	25,000,000	-
	ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	28,240,556	25,000,000
	ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	6,868,103	6,094,433
	ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	8,217,887	7,275,074
	ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	30,118,995	26,665,810
	ඉල්ලූ විට ලබා ගත හැකි පොලි, ස්ථාවර තැන්පතු - නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	4,064,095	2,237,765
		124,847,967	133,378,267

11	**ප්‍රකාශිත මූල ධනය**		
	සමන්විත වන්නේ		
	දැක්වෙන පරිදි මූල ධන සංචිතය	68,500,000	68,500,000
	4,000,000 සාමාන්‍ය කොටස්	40,000,000	40,000,000
		108,500,000	108,500,000

12	**හිමිකම්වල වෙනත් සංරචක**		
	දේපළ යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණවල ප්‍රත්‍යාගණන සංචිත		
	වර්ෂය ආරම්භයේ ශේෂය	220,795,490	220,795,490
	වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනයේ අතිරික්ත	-	-
	නැවත ඇගයීම ආපසු හැරවීම		
	වර්ෂ අවසානයේ ශේෂය	220,795,490	220,795,490

2010.12.31 දිනට දේපළ පිරියත හා උපකරණයන්හි පැවති සාධාරණ වටිනාකම තීරණය කිරීම සඳහා සමාගම විසින් වර්ෂය තුළදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කටයුතු ඉටු කරවා ගෙන ඇත. 2010.12.31 දා සිට බලපැවැත්වෙන මුල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් වටිනාකම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් වටිනාකම් මත පදනම් වී ඇත.

වත්කම් වර්ගය	2010.12.31 දිනට ශුද්ධ පවත්වාගෙන යන අගය රු.	2010.12.31 දිනට ප්‍රත්‍යාගණිත අගයන් රු.	ප්‍රත්‍යාගණිත සංචිත රු.
ඉඩම	538,000	70,000,000	69,462,000
යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ	181,790	1,138,000	956,210
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,208,140	1,925,000	716,860
කාර්යාල උපකරණ	461,909	1,511,700	1,049,791
පරිගණක උපාංග	741,648	916,850	175,202
මෝටර් වාහන	192,128	12,195,037	12,002,909
පා පැදි	1	2,500	2,499
සිලින්ඩර	36,892,075	173,033,000	136,140,925
ආවුද සහ උපකරණ	30,216	319,310	289,094
	40,245,907	261,041,397	220,795,490

	2013 රු.	2012 රු.
13 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම		
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		
2012.01.01 දිනට ශේෂය	6,286,406	6,340,393
එකතු කළා : 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,248,472	838,395
	7,534,878	7,178,788
අඩු කලා වර්ෂය තුල දි මුදලින් ගෙවීම	(577,845)	(892,382)
වර්ෂය අවසානයේ ශේෂය	6,957,033	6,286,406

13.1 2013.12.31 දිනට නිර්වචිත ප්‍රතිලාභ වගකීම් වටිනාකම් නිර්ණය කිරීම සඳහා යොදා ගත් මූලික පරාමිතික පහත පරිදි වේ.

	2013	2012
වට්ටම් ප්‍රතිශතය	12%	12%
වාර්ෂික වැටුප් වර්ධක ප්‍රතිශතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	5%	5%

නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම 2013 දෙසැම්බර් 31 දිනට ආගනනය කර ඇති අතර ඊට භාවිත කරන ලද ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

	2013 රු.	2012 රු.
14 විලම්භිත බදු		
2013.01.01 දිනට ශේෂය	32,029,950	44,361,740
වර්ෂයේ මාරු කිරීම්	(2,249,094)	(12,331,790)
2013.12.31 දිනට ශේෂය	29,780,856	32,029,950

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගිණුම් පරිවර්තනයේ දී කරන ලද ප්‍රත්‍යාගණිත වටිනාකම (151,333,490) අනුව 2010.12.31 දිනට රු 58,717,596 ක විලම්භිත වටිනාකමක් නිර්මාණය වේ. මෙම විලම්භිත බදු වගකීම 01.01.2011 දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂයේ සිට තාවකාලික කාල වෙනස අනුව

අය කිරීමට හෝ ආපසු හැරවීම සිදු කළ යුතුය. 2010 වර්ෂයේ ආදායම් බදු අනුපාතය (2010 - 35%). 2011 සහ 2012 වර්ෂ වල අඩු වීමට ලක් වූ නිසා විලම්භිත බදු වගකීම පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයට ආපසු හැරවීම සිදු කරන ලදි.

	2013 රු.	2012 රු.
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	2,249,094	12,331,790

15 <u>අසම්භාව්‍ය වගකීම්</u>

ප්‍රමාණාත්මකව සැලකිය යුතු කිසිදු අසම්භාව්‍ය වගකීමක් ශේෂ පත්‍රයට පැමිණ නැත.

16 <u>ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්</u>

ගැලපීම් හෝ අනාවරණය කිරීම් සඳහා අවශ්‍ය වන සිද්ධි කිසිවක් ශේෂ පත්‍ර දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා පැන නැගී නැත.

17 <u>හෙළිදරව් කිරීම්</u>

<u>නැවත පිරවීමේ ක්‍රියාවලිය</u>

වර්ෂය තුළදී කළුතර නාගොඩ නැවත පිරවුම් ඒකකයේ සිදු වූ ක්ලෝරින් කාන්දුව නිසා අදාළ නැවත පිරවීමේ කාර්යය හොරණ කර්මාන්ත ඒකකයේ පිහිටි නව ස්ථානයකට මාරු කිරීමට සිදු විය. මෙම ස්ථානයේ සිදු වූ වෙනස නිසා දළ වශයෙන් වූ ලාභය අඩුවීමට මින් බලපෑමක් ද ඇත.

<u>හයිඩ්‍රොලික් පරීක්ෂණ කිරීමේ ගාස්තු + පිරිසිදු කිරීම පරීක්ෂා කිරීම හා වියලීමේ ගාස්තු</u>

හයිඩ්‍රොලික් පරීක්ෂණ පිරිසිදු කිරීම සහ වියලන ගෙවීම් වශයෙන් 31.12.2013 දිනෙන් අවසන් වර්ෂය තුළ දී රු 1,078,318.13 දරණ ලදි. එම පිරිවැය අතරින් 31.12.2012 න් අවසන් වර්ෂයෙන් ඔබ්බට වලංගු හයිඩ්‍රොලික් පරීක්ෂණ සඳහා දරණ ලද රු. 94,171 ක් 2014 වර්ෂයට විතැන් කර ඇත.

18 <u>කොටසක ලාභාංශය</u>

2013 දෙසැම්බර 31න් අවසන් වර්ෂය

	2013 රු.	2012 රු.
ප්‍රකාශිත අවසන් ලාභාංශය	4,000,000	5,000,000
සාමාන්‍ය කොටස් අනුව සංඛ්‍යාව	4,500,000	4,000,000
කොටසක ලාභාංශය	1.12	1.25

2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂයේ කොටසකට (4,000,000) මුල් සහ අවසන් ලාභාංශය වශයෙන් රු. 1.00 ක් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් නිර්දේශ කෙරිණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ නියමයන් (SLFR/LKAS) හි අංක 10 පරිදි මෙය වාර්ෂික මහා සභා රැස්වීමේ දී කොටස්කරුවන්ගේ අනුමැතියෙන් සම්මත විය යුතු වේ. අවසන් ගිණුම්කරණයෙන් පසු යෝජිත මෙම ලාභාංශය ප්‍රකාශයට පත් කෙරේ. එහෙත් 2013 දෙසැම්බර් 31 දින දැක්වෙන පරිදි වගකීමක් වශයෙන් අනුමත නොකෙරේ.

ආයතනික සැලැස්ම - උපායමාර්ගික ව්‍යාපාරික ඒකකය

උපායමාර්ගික ව්‍යාපාරික අංශ



උපායමාර්ගික ඉලක්ක

පාර්ශවකරුවන් / සේවාවන්

- ජල පිරිපහදු ක්‍රියාවලිය
- රබර් ආශ්‍රිත නිෂ්පාදන
- සබන් සහ විෂබීජ නාශක නිෂ්පාදනය
- රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය
- පිහිනුම් තටාක පවිත්‍රකාරක රසායනිකයන් සැපයීම
- බීම සහ ආහාර ඇසුරුම් පිරිසිදුකරණය
- කඩදාසි නිෂ්පාදන ක්‍රියාවලිය
- ගැල්වනයිස් කර්මාන්තය
- ඉන්දියානු, පාකිස්තාන සහ බංග්ලාදේශ සැපයුම්කරුවන් හවුල්කරුවන්

වර්තමාන සංවිධාන සැලැස්ම



සටහන

සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතු වර්තමානයේ බාහිර ආයතනයක් මගින් සිදු කිරීමට කටයුතු සලසා ඇත.

2013 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2014 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
2013 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2014 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

	2012 සත්‍ය රු.'000	2013 සත්‍ය රු.'000	2014 අයවැය ගත රු.'000
ජංගම නොවන වත්කම්	274,599	302,224	398,399
ජංගම වත්කම්	193,255	195,336	107,402
මුලු වත්කම්	467,854	497,560	505,801
ස්කන්ධ මූල ධනය සහ බැරකම්			
මූල ධනය සහ සංචිත			
කොටස් හිමියන්ගේ පදනම	397,259	423,321	447,617
ජංගම නොවන වගකීම්	38,316	36,738	39,382
ජංගම වගකීම්	32,278	37,501	18,802
මුලු කොටස්, වගකීම්	467,854	497,560	505,801
ආදායම්	217,297	206,268	264,413
විකුණුම් පිරිවැය	(125,823)	(107,704)	139,734
දළ ලාභය/(පාඩුව)	91,471	98,564	124,679
අනෙකුත් මෙහෙයුම් ආදායම්	15,633	20,222	5,900
	107,104	118,786	130,579
මෙහෙයුම්වලින් ලැබෙන ලාභය/(පාඩුව)	32,112	37,272	37,996
බදු පූර්ව ලාභය/(පාඩුව)	32,015	37,162	37,851
බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය/(පාඩුව)	37,325	31,062	27,510
කොටසක ඉපයීම	9.33	7.76	6.87
කොටසක ලාභාංශ	1.25	1.12	1.25

සමාගමේ කාර්යය සාධනය ඇගයීම

වර්ෂ 1975 පටන් කොළඹ 13, ශ්‍රී රාමනාදන් මාවතේ වරාය අධිකාරිය වෙතින් බදු පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක සිය ප්‍රධාන කාර්යාලය සහ කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ල ගබඩාව පවත්වාගෙන යනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්ය ලෙස රටේ සහ වෙළඳපොල අවශ්‍යතා අනුව ක්ලෝරින්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ඉන්දියාව, බංග්ලාදේශය සහ පකිස්තානය වැනි රටවලින් ආනයනය කර විකිණීම හඳුන්වා දියහැක.

ක්ලෝරින් ගබඩා කිරීමේ කටයුත්ත ඉතා ආරක්ෂිතව ජනාකීර්ණ ප්‍රදේශවලින් බැහැරව කළ යුතු කටයුත්තක් බැවින් ඒ සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් හොරණ කර්මාන්තපුරයේ ගබඩාවක් පවත්වා ගෙන යනු ලැබීය.

හොරණ කර්මාන්තපුරයේ පවත්වා ගෙන යනු ලැබූ මෙම සිලින්ඩර් ගබඩා කිරීමේ කටයුත්ත නිසා අප ආයතනයට විශාල මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවීමට සිදු විය. මේ නිසා ආයතනය විසින් කරන ලද ඉල්ලීම සලකා බැලූ එවකට කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමා ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන සංකල්පය ක්‍රියාවේ යොදවනු වස් 2006.11.22 වන දින කැබිනට් අනුමැතියෙන් කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ අක්කර 2ක ඉඩම (ලොට් අංක 558 1/2 සහ 558 2/2) දිගුකාලින බදු ක්‍රමය යටතේ පරන්තන් කෙමිකල්ස් සමාගමට (2009 නොවැම්බර් 29 වන දින පටන් ක්‍රියාත්මක වන පරිදි) ප්‍රදානය කරන ලදී.

වර්ෂ 2008 වූ මැයි මස 01 වන දින සිට කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ කි.ග්‍රෑ.900 සිලින්ඩර්වල සිට කි.ග්‍රෑ.68 සිලින්ඩර්වලට ක්ලෝරින් නැවත පිරවීම ආරම්භ කරනු ලැබීය. මෙම නව ක්‍රියාමාර්ගය සමඟ පෞද්ගලික ආයතනයක් වෙත ඇදී ගිය විශාල මුදල් ප්‍රමාණයන් ඉතිරි කර ගැනීමට හැකි විය. විශේෂයෙන් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 32.015 ක බදු පෙර ලාභයක්ද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා රු. මිලියන 37.16 ක බදු පෙර ලාභයක් ද උපයා ඇත.

සමාගම තෝරා ගත් නව රසායන ද්‍රව්‍ය කිහිපයක් විකිණීම 2012 දෙවන කාර්තුවේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද මෑත කාලයේ කළුතර පුලර්ටන් ඒකකයේ සිදු වූ ක්ලෝරින් කාන්දුවත් සමඟ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලියට ඇති වූ දැඩි බලපෑම නිසා කල් දැමීමට තීරණය කෙරිණි.

2012 වර්ෂයෙදි කළුතර ඒකකය තුළ සිදු වූ ක්ලෝරින් කාන්දු වීම සිදු වීමට සමගාමීව එම කාර්යය සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීමට සමාගමට නොහැකි විය. එම හේතුව නිසාම 2013 වසර තුළ සිදු කිරීමට අපේක්ෂා කල නව රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කටයුතු ද කල් දැමීමට සිදුවිය. එය සමාගමේ ලාභයට ද දැඩි බලපෑමක් ඇති කළේය. එහෙත් මෙම වසරේ පූර්ව භාගයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අක්කර 2 1/2 කින් යුක්ත භූමියක් හොරණ වගවත්ත කර්මාන්ත ඒකකයෙන් ලබා ගැනීමට හැකි වී ඇති අතර ඒ අනුව ක්ලෝරින් නැවත පිරවුම් ඒකකය එම ස්ථානයේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.

සැලකිය යුතු රැකියා ප්‍රමාණයක් උත්පාදනය වීම තුළින් රටේ සංවර්ධනයට දායක වීමට හැකියාවක් ද මේ තුළින් ලැබෙනු ඇත.

ක්ලෝරින් සැපයුමේ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා සමාගම නැවත පිරවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා සුදුසු විකල්ප ස්ථානයක් සොයාගැනීමේ කටයුත්තේ දැනට නිරත වී සිටියි. කෙසේ නමුදු තාවකාලික පදනම මත හොරණ ප්‍රදේශයේ බාහිර පිරවුම් සැපයුම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට දැනට ආයතනයට සිදු වී ඇත.

මෑත කාලයේ සිදු වූ ක්ලෝරින් කාන්දුව නිසා පිරවුම් ස්ථානවල සිදු වූ වෙනස්කම් නිසා සමාගමට රු. මිලියන 6.7 ක මූල්‍ය අලාභයක් දැරීමට සිදු විය.

ආයතනික යහපාලනය

පරන්තන් කෙමිකල්ස් සමාගම උසස් යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමට දැඩි කැපවීමෙන් බැඳී සිටින ආයතනයකි. යහපාලන සංකල්පය මූලික වශයෙන් ආයතනික ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ සේවකයින් පොදු රීති මාලාවකට සම්බන්ධ කොට සමාගමේ කොටස් හිමියන් සහ ඇල්මක් සහිත සියලු පාර්ශවයන්ගේ අරමුණු සාක්ෂාත් කරනු ලබන සංකල්පයකි. යහ කළමනාකරණය සාරධර්ම රැකගැනීමටත් කළමනාකරණයට සහ ව්‍යාපාර පරිපාලනයට හා ඉන් පාර්ෂවකරුවන් හට ද ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට මග පාදයි. තවද සේවාවන්හි වගකිවයුතුභාවයද යහපාලන ප්‍රතිපත්තිවල තවත් අංගයකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ රීතිමාලාව මෙන්ම 2007 අංක 07 දරණ සමාගම් පනත සහ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මූල්‍ය රීති සංග්‍රහයට අප සමාගම දක්වන අනුකූලතාවය මෙම ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේදී මෙන්ම අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ සහ විගණන කමිටු වාර්තාවේ මැනවින් නිරූපණය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනයේ ප්‍රගමනය සහ සාර්ථකත්වය පිළිබඳ මූලික වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමුහිකව දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වන ව්‍යවසායකත්ව නායකත්වය ලබා දීම විචක්ෂණ සහ ඵලදායි රාමුවක් තුලදී ලබා දීම නිසා ආයතනයේ අවදානම හඳුනා ගැනීමට කළමනාකරණයට අනගි පිටුවහලක් සපයයි. ඔවුන්ගේ උපක්‍රමික දැක්ම, ආයතනය මූල්‍ය සහ මානව සම්පත ආයතනයේ අරමුණු ලඟා කර ගැනීමට යොදවන බවට සහ කළමනාකරණ ඵලදායිතා අධීක්ෂණය තහවුරු කරයි. එමෙන්ම ආයතනයේ වටිනාකම් සහ ප්‍රමිතීන් ස්ථාපනය කිරීමට සහ කොටස් හිමියන්ගේ මෙන්ම අදාළ වෙනත් පාර්ශවයන් කෙරෙහි වගකීම් ඉටුවන බවට තහවුරුවක් ලබා දෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි පැවරෙන විශේෂිත වගකීම් පහත පරිදි වේ.

- ආයතනික අරමුණු අයවැය සහ පුරෝකථනයන් නිරන්තර පසුවිපරම
- මෙහෙයුම් සහ ක්ෂේත්‍ර කාර්ය සාධන පසුවිපරම
- ප්‍රාග්ධන ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සහ පෙරගමන්කරුවකු වීම
- ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම තහවුරු කිරීම
- ඉතා ඉහළ මට්ටමේ ආචාර ධර්ම සහ නීතිගරුකතාවය තහවුරු කිරීම
- වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය ලබා දීම
- කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා වාර්ෂික ලාභාංශ යෝජනා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිතුමා, භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂතුමා ඇතුලුව විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් සහ එක් විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත වන්නේය. ඔවුන්ගේ නම් සහ තනතුරු මතු සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගම් ප්‍රගති වාර්තා නිරන්තරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විමර්ශනයට භාජනය කරන අතර ප්‍රමිතිගත න්‍යාය පත්‍රයක් අවශ්‍ය අවස්ථාවලදී අදාළ අමතර කරුණු ද ඇතුලත් කරමින් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක සහභාගිත්වය පිළිබඳ විස්තර පහත දක්වා ඇති පරිදි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය - 2013

අධ්‍යක්ෂවරු	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
අචාර්ය ඩී.ජේ.යූ.පුරසිංහ මහතා (සභාපති සහ අධ්‍යක්ෂ - විධායක)	12
ආනන්ද ජයසිරි ගමගේ මහතා (විධායක)	11
එච්.එම්.ආර්.කිරිඇල්ල මහතා (විධායක නොවන)	10
බී.පී.ගුණවර්ධන මහතා (විධායක නොවන) 2013.06.24 සිට	05
එච්.ඒ.එන්.එස්.කුමාර මහතා (විධායක නොවන) 2013.09.17 සිට	03
මායලඝු ශෂිකරන් මහතා (විධායක නොවන)	07
ඩී.එම්.පී.ඒ. දසනායක මහතා (විධායක නොවන) 2013.06.27 සිට විශ්‍රාම	06
සරත් කුමාර මහතා (විධායක නොවන) 2013.09.17 සිට විශ්‍රාම	08
ජේ.ඩී.අජිත් විශ්වමිත්‍ර මහතා (විධායක නොවන)	06

කළමණාකරණ කමිටු රැස්වීම්

ආයතනයේ සභාපති, සාමාන්‍යාධිකාරී ආයතනයේ ඉහළ කලමණාකාරිත්වය සමඟ අවම වශයෙන් මසකට වරක් රැස්වීමක් පවත්වනු ලබන අතර එහිදී මෙහෙයුම් කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙරාතුව ව්‍යාපාරික තිරණ විස්තරාත්මකව විශ්ලේෂණයට ලක් කිරීම හා ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ මූලික තිරණ ගැනීම කළමනාකරණ කමිටුව මගින් ඉටු කෙරේ.

අධ්‍යක්ෂ ධූරකාලය විශ්‍රාම ගැන්වීම සහ තෝරා පත්කර ගැනීම

සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම තුනෙන් පංගුවක් වන සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් විශ්‍රාම ගැන්වෙන අතර (අධ්‍යක්ෂවරු තුනෙහි ගුණිතයක් වන අවස්ථාවක ආසන්නතම තුනෙන් එකට) නැවත තෝරා පත් කර ගැනීම සිදු කරනු ලබයි. ආයතනයේ ව්‍යවස්ථාවලිය අනුව පත් කර ගන්නා ලද අධ්‍යක්ෂවරයෙකු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත පත් කර ගත යුතුය.

විගණන කමිටු රැස්වීම්

විගණන කමිටුව ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කරනු ලබන අතර යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ආයතනය තුල පැවතීමට එය උපකාර වෙයි. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්ගෙන් සමන්විත වන අතර එහි සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා වේ. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, සාමාන්‍යාධිකාරී සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීම්ට සහභාගි කරගනු ලැබේ. විගණන කමිටුව නිරන්තරයෙන්ම අභ්‍යන්තර විගණක වාර්තා, මාසික ප්‍රගති වාර්තා, විකුණුම් වාර්තා, පද්ධති සහ පාලනයන් විමර්ශනයට භාජනය කරන අතර ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙනු ලබයි.

විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය - 2013

අධ්‍යක්ෂවරු	සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව
එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා (විධායක නොවන)	04
බී.පී.ගුණවර්ධන මහතා (විධායක නොවන)	01
එච්.ඒ.එන්.එස්.කුමාර මහතා (විධායක නොවන)	01
මායලඝු ශෂිකරන් මහතා (විධායක නොවන)	01
ඩී.එම්.පී.ඒ.දසනායක මහතා (විධායක නොවන) 2013.06.27 සිට විශ්‍රාම	02
සරත් කුමාර මහතා (විධායක නොවන) 2013.09.17 සිට විශ්‍රාම	03

අභ්‍යන්තර පාලනය

සමාගමේ කොටස් හිමියන් අපේක්ෂිත ඉහළ ප්‍රතිලාභයන් ලබා දීම සඳහාත් ආයතනයේ වත්කම් සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහාත් අවශ්‍ය යහපත් අභ්‍යන්තර පාලන පරිසරයන් ඇති කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. ආයතනයේ ව්‍යාපාරික අවදානම ඵලදායි සහ සුදුසු ක්‍රමවේදයකට අනුකූලව සිදුකිරීමට අවශ්‍ය පද්ධතීන් බිහි කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ. ආයතනයට මුහුණදිය හැකි අවදානම් හඳුනා ගැනීම ඇගයීම සහ අධීක්ෂණය සහ විසඳුම් නිර්දේශ කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවට පවරා ඇත.

මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සහ විනිවිද භාවය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කරනු ලබන අතර වරලත් ගණකාධිකාරි හේමචන්ද්‍ර සහ සමාගම බාහිර විගණකවරු ලෙස කටයුතු කරනු ලබයි. විගණකවරුන්ට අවශ්‍ය තොරතුරු සියල්ල සපයා ඇති අතර ඔවුන්ට වෘත්තීමය නිදහස සහිතව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිය මතය ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සහ ඉහළ කළමනාකරණය වෙතින් අවකාශ ලබා දී ඇත.

සම්මත ආචාරධර්ම

අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය අනුව ඉහළ මට්ටමේ විනයක්, පැවැත්මක්, ආයතනය තුලදී සේවකයින්ගෙන් බලාපොරොත්තු වන අතර අවංකව සහ කැපවීමෙන් යුතු සේවයක් ද අපේක්ෂා කෙරේ. සියලුම සේවකයන් සිය උපරිම සේවය අප ගනුදෙනුකරුවන්ට, රජයට සහ ජනතාවට ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී ලබා දීම අත්‍යවශ්‍ය වේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාලසීමාව තුල දී ම ගෙවා නිම කරන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

මූල්‍ය වාර්තා සහ ඉදිරිපත් කිරීම්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනයට ලක් කරන ලද අතර ආයතනයේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීම පිළිබඳ සෑහීමකට පත් වේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය මෙම ගිණුම් ප්‍රකාශනයේ 22 පිටුවේ සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පරන්තන් කෙමිකල්ස කම්පැනි ලිමිටඩ්



එච්. එල්. විපුල සිල්වා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලිය හා යහපත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතීන් අභ්‍යන්තර සම්බන්ධතාව අධ්‍යනය කිරීම සහ එහි ගුණාත්මක ලක්‍ෂණ, අඩුපාඩු සහ අවශ්‍ය වර්ධනයන් පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කිරීම විගණන කමිටුවේ මූලික කාර්යභාරය වේ. පහත සඳහන් කාර්ය පිළිබඳ අධීක්‍ෂණය සහ පසුවිපරම විගණන කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

- මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය සහ සම්පූර්ණභාවය
- අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මකතාවය හා සම්පූර්ණත්වය
- අභ්‍යන්තර හා බාහිර විගණනයේ කාර්යසාධන ඵලදායිතාව
- ව්‍යවස්ථාපිත සහ නීතිමය අනුකූලතාවය

විගණන කමිටුව

විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්‍ෂකතුමා එහි සභාපතිත්වය දරනු ලබයි. විගණන කමිටුව පහත අධ්‍යක්‍ෂකවරුන්ගෙන් සමන්විත වේ.

පී. සරත්කුමාර මහතා - විගණන කමිටුවේ සභාපති (භාණ්ඩාගාර නියෝජිත) - විශ්‍රාම
එච්. ඒ. එන්. එස්. කුමාර මහතා - විගණන කමිටුවේ සභාපති (භාණ්ඩාගාර නියෝජිත) අළුතින් පත්කරන ලද
එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා - සාමාජික
මායලඝු ශෂිකරන් මහතා - සාමාජික

රැස්වීම සහ සහභාගිත්වය

විගණන කමිටුව 2013 වර්ෂය සඳහා රැස්වීම් වාර 04 ක් පවත්වා ඇති අතර එහිදි සාකච්ඡා කරන ලද වැදගත් කරුණු අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කරන ලදි. විගණන කමිටුවල සහභාගිත්වය පිළිබඳ දත්ත ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, කළමනාකාර අධ්‍යක්‍ෂ සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීමට සහභාගි කර ගනු ලැබේ.

කාර්යභාරය

කෙටුම්පත් ගිණුම් විමර්ශනය, බාහිර විගණක වාර්තාව, අභ්‍යන්තර විගණක වාර්තාව, මාසික ප්‍රගති වාර්තාව, විකුණුම් වාර්තාව සහ වංචා දෝෂ සහ මග හැරීම් ආදී ඇතිවිය හැකි දෝෂ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් සහ පසුවිපරම් කිරීමෙන් විගණක කමිටුව වටිනා කාර්යභාරයක් ආයතනය වෙනුවෙන් ඉටු කරනු ලබයි. අවදානම් අවම කිරීමට සහ පද්ධතිය තව දුරටත් ශක්තිමත් කරමින් වංචා, වැරදි සහ දෝෂ සිදුවීමට ඇති හැකියාව ඉතා අවම කරනු ලබයි.

අභ්‍යන්තර පාලන පද්ධතිය

2013 වසර තුල දී අභ්‍යන්තර විගණක වාර්තා සියල්ලම විගණක කමිටුවේ විමර්ශනයට ලක් වූ අතර අභ්‍යන්තර විගණක විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාවේ යෙදවීමට සිදුවිය.

අනුකූලතාවය

විගණන කමිටුව විසින් ව්‍යවස්ථාපිත වෙන් කිරීම් සහ ගෙවීම්වල අනුකූලතාවය හා විශ්වාසදායක යාවත්කාලීන මූල්‍ය තොරතුරු 2007 අංක 7 දරණ සමාගම් පනත පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රීති මාලාවන්, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයත්, ප්‍රසම්පාදන රීති මාලාව සහ රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු කිරීමට මහත් පිටුවහලක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන ලදී.

විගණන කමිටුව වෙනුවෙන්,

මායලඝු **ශෂිකරන්**
සාමාජික - විගණන කමිටුව
2014, මැයි 28

එච්. එම්. ආර්. කිරිඇල්ල
සාමාජික - විගණන කමිටුව

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
ප්‍රධාන මූල්‍යමය අවස්ථා ඇතුලත් පස් අවුරුදු සාරාංශය
දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	2013 රු.	2012 රු.	2011 රු.	2010 රු.	2009 රු.
ආදායම	206,268,365	217,294,221	186,898,881	179,531,798	191,919,442
විකුණුම් පිරිවැය	(107,704,481)	(125,823,189)	(98,658,356)	(105,762,236)	(111,419,740)
දළ ලාභය	98,563,884	91,471,032	88,240,525	73,769,562	80,499,702
අනෙකුත් මෙහෙයුම් ආදායම්	20,221,718	15,633,150	5,666,039	7,454,108	5,197,995
	118,785,602	107,104,182	93,906,564	81,223,670	85,697,697
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	(3,307,057)	(2,554,403)	(2,757,642)	(437,817)	(1,088,055)
පරිපාලන සහ ආයතන වියදම්	(78,206,145)	(72,438,138)	(63,301,162)	(58,148,781)	(54,017,686)
මූල්‍යමය වියදම්	(110,369)	(95,792)	(136,125)	(413,523)	(487,225)
බදු පූර්ව ලාභය	37,162,031	32,015,849	27,711,635	22,223,548	30,104,731
බදු අය කිරීම	(6,099,832)	5,309,622	5,260,991	(12,655,534)	(15,641,455)
කාල සීමාව සඳහා ශුද්ධ ලාභය	31,062,199	37,325,471	32,972,626	9,568,014	14,463,276
කොටස්කරුවට ගෙවූ ලාභාංශය	4,500,000	5,000,000	3,000,000	3,000,000	3,000,000
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ	301,236,277	273,854,360	275,366,807	70,719,774	77,479,027
කෙරීගෙන යන වැඩ	987,330	744,330	744,330	1,319,330	-
ජංගම වත්කම්	195,336,180	193,255,173	166,118,013	139,778,694	112,949,955
මුළු වත්කම්	497,559,787	467,853,863	442,229,150	211,817,798	190,428,982
ස්කන්ධ මූල ධනය සහ බැරකම්					
මූළ ධනය හා සංචිත					
ප්‍රකාශිත මූල ධනය	108,500,000	108,500,000	108,500,000	108,500,000	108,500,000
රඳවා ගත් ලාභය	314,821,361	288,759,162	254,433,691	60,544,748	54,976,734
කොටස් හිමියන්ගේ අරමුදල	423,321,361	397,259,162	362,933,691	169,044,748	163,476,734
ජංගම නොවන වත්කම්	36,737,889	38,316,356	50,702,133	13,211,284	10,128,393
ජංගම වත්කම්	37,500,537	32,278,345	28,593,326	29,561,766	16,823,855
මුලු ස්කන්ධ මූල ධනය සහ බැරකම්	497,559,787	467,853,863	442,229,150	211,817,798	190,428,982

රැස්වීම පිළිබඳ දැන්වීම

සමාගමේ 23 වැනි වාර්ෂික මහා සභා රැස්වීම, 2014 අගෝස්තු මස 7 වන දින ප.ව. 2.00 ට කොළඹ 13, සර් රාමනාදන් පාරේ අංක 100/25 දරණ ස්ථානයේ, පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයේ දි පැවැත්වෙනු ඇති බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය

1. 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කෙරුණු ගිණුම් ඉදිරිපත් කිරීම සහ ඒ සම්බන්ධව විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම.

2. අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත පරිදි ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

3. සමාගමේ ව්‍යවස්ථාවේ 87 සහ 88 වගන්තිවලට අනුකූලව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නැවත තෝරා පත් කිරීම.

4. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 155 (අ) වගන්තියේ දැක්වෙන පරිදි විගණකවරයා නැවත පත් කිරීම සහ විගණකවරයාගේ ගාස්තු නියම කිරීම.

මණ්ඩලයේ අණ පරිදි,

එච්. එල්. විපුල සිල්වා
ලේකම්
2014 ජුලි 17

සටහන් :

1. **රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හිමිකම් ලබන සාමාජිකයෙකුට, ඔහු වෙනුවෙන් සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම පිණිස පුද්ගලයෙකු පත් කිරීම සඳහා හිමිකම් ඇත.**

2. **පෙරකලාසිකරුවෙකු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.**

3. **පෙරකලාසි ආකෘති පත්‍රයක් මෙම වාර්තාවට අමුණා ඇත.**